# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 79 —1973 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා — 1973.09.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 965 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 961 | මිළ පාලන දැන්වීම් ... ... ... | 990 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය ... | 962 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 963 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 992 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... ... | — | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත සහ නිවාස සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී, (ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශක වරුන්ගේ නාමාවලියක්ද පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 452

අංකය : සී. 368/ආර්ජිසීපී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම් සඳහන් නිලධාරියා 1973 ඔක්තෝබර් 01 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

තාවකාලික මේජර් ඒ. සී. ප්‍රනාන්දු, ලසිංරෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් 18 දින,
කොළඹදීය.

9–892—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 453

අංකය : සී. 17/ආර්ජිසීපී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්වීම් අත්හැර යාමක් සහ පත් කිරීමක්**

පත්වීම අත්හැර යාම

යුද්ධ හමුදා පනතේ (357 අධිකාරය) 13 (1) වැනි වගන්තිය යටතේ, පහත නම් සඳහන් නිලධාරියා, 1973 අගෝස්තු මස 15 දින සිට ආධුනිකයින් බඳවන නිලධාරියෙකු වශයෙන් වන පත්වීම් අත්හරින ලදී :—

කපිතාන් එච්. පී. ජයසූරිය, ලකාහ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**


961—බී 71022—10,362 (73/09)

A 1

පත් කිරීම

යුද්ධ හමුදා පනතේ (357 අධිකාරය) 13 (1) වැනි වගන්තිය යටතේ, පහත නම සඳහන් නිලධාරියා, 1973 අගෝස්තු මස 15 දින සිට ආධුනිකයින් බඳවන නිලධාරියෙකු වශයෙන් :—

ලුතිනන් එස්. එම්. මුතතම්බි, ලකාහ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් 11 දින,
කොළඹදිය.

9-872—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

# අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 454**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත**

එම්. සී. ජේසුරත්නම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් පේදුරු තුඩුව ම. උ. අංක. 9281, 7630, 7631 සහ 7180 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස 1973 සැප්තැම්බර් මස 25 වැනි දින සිට පේදුරු තුඩුව අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

පී. එදුස්සූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1973 සැප්තැම්බර් මස 6 සිට 9 දක්වා සහ 11 සිට 13 දින දක්වා හලාවත අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. පී. ඩබ්ලිව්. අබේසූරිය මහතා 1973 සැප්තැම්බර් මස 8 වැනි දින මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. කුලතුංග මහතා 1973 සැප්තැම්බර් මස 9 සිට 12 දක්වා මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සේපාල සමරසිංහ මහතා 1973 සැප්තැම්බර් මස 5 සිට 7 දක්වා මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

ඩී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. එස්. සුරවීර මහතා 1973 සැප්තැම්බර් මස 3 වැනි දින කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

ඊ. පී. රත්වත්තේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1973 සැප්තැම්බර් මස 13 වැනි දින කුලියාපිටිය පලාත් ආණ්ඩු සභා සීමාව තුළ කනාදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට ඔබව පත් කරමි.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1973 සැප්තැම්බර් මස 13, 14, 15, 17 සහ 1973 ඔක්තෝබර් මස 1 සහ 8 දිනයන්හි හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

සී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. එස්. සුරවීර මහතා 1973 සැප්තැම්බර් මස 8 වැනි දින කෑගල්ල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

එම්. ජී. එච්. ද අල්විස් මහතා කොළඹ (11) අංක. 11/429/69, 11/2209/71, 11/2210/71 සහ 11/2211/71, 11/ඒ/2109, ගාල්ල 11/මා/1261, මාතර 11/මා/910, කොළඹ (11) 11/ඒ/1061, 11/762/69, අයිඩීඑල්ටී, 11/මා/1084 සිට 11/මා/1089 දක්වා 11/මා/1064 සිට 11/මා/1069 දක්වා, කොළඹ (11) 11/392/68, 11/392/68, 11/ඒ/1544 සහ මාතර 11/මා/1454 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම පිණිස 1973 සැප්තැම්බර් මස 18, 19, 20, 22, 24, 25, 27, 28 සහ 29 දිනයන්හි කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

ඊ. ගනේගොඩ මහතා කොළඹ (14) අංක. 14/333/71, 14/598/71, 14/293/71 දරණ නඩු ඇසීමට සහ අසා අවසානකර තීන්දු දීම පිණිස 1973 සැප්තැම්බර් මස 24, 28, සහ 29 දිනයන්හි කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

බී. සී. ප්‍රනාන්දු මහතා කොළඹ (16) අංක. 16/1022/71 සහ 16/643/70 දරණ නඩු ඇසීමට සහ නිමකර තීන්දු දීම පිණිස 1973 සැප්තැම්බර් මස 21 සහ 28 දිනයන්හි කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

එන්. ටී. හේරත් මහත්මිය ඇගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 සැප්තැම්බර් මස 13 වැනි දින සිට දින 15 කාල සීමාවකට පින්නවල ගම්බද උසාවියේ අංක 3423 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිණිගොඩ බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

පී. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, අයි. එම්. වීරරත්න මෙනවිය 1973 අගෝස්තු මස 23, 24, 25, 27, 28, 29 සහ 1973 සැප්තැම්බර් මස 6, 8, 10 සහ 11 දිනයන්හි රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් හා කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

පී. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. එල්. මාලවන මහතා 1973 සැප්තැම්බර් මස 4 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් හා කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

පී. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. වෙත්තසිංහ මහතා 1973 අගෝස්තු මස 30, 31 සහ සැප්තැම්බර් මස 3 වැනි දිනයන්හි රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් හා කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. කරුණාරත්න මහතා 1973 අගෝස්තු මස 28 සිට 30 දක්වා අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ පහල බුලත්ගම, අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

යූ. එල්. අබ්දුල් මජීඩ් මහතා 1973 සැප්තැම්බර් මස 1, 3, 4, 5, 6, 7, 8, 17, 18, 19, 20, 21 සහ 22 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

එම්. එච්. කාරියප්පර් මහතා 1973 සැප්තැම්බර් මස 24 සිට 29 වැනි දින දක්වා මඩකලපුව දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. සී. ජබාර් මහතා 1973 සැප්තැම්බර් මස 10, 11, 13, 14 සහ 15 වැනි දිනයන්හි, හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපුව දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

කේ. කණපතිපිල්ලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඇම්. කේ. සෙල්වරාජා මහතා 1973 සැප්තැම්බර් මස 11 වැනි දින ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තු ගම්බද උසාවි සභාපති සහ කඩ්ඩුකුලම් සහ තම්පලාකාමම් පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

එන්. ටී. හේරත් මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඇම්. සී. ජයරාණි පීරිස් මෙනවිය 1973 සැප්තැම්බර් මස 10 වැනි දින බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ වියළුව ගම්බද උසාවි සභාපති සහ බුත්තල අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. ජේ. සහිඩ් මහතා 1973 සැප්තැම්බර් මස 18, 19, 20, 21 22, 24, 25, 27, 28 සහ 29 දිනයන් හි පානදුර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ සහ පානදුර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

රමණී ද සිල්වා මෙනවිය 1973 සැප්තැම්බර් මස 17 වැනි දින හෝ නැවත නියමයක් කරනතුරු, පානදුර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ සහ පානදුර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

පී. ඕ. ආර්. විජේතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. ආර්. සමරජීව මෙනවිය 1973 සැප්තැම්බර් මස 24 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු කඩවත් සතර වැලිගම් කෝරලේ කදුබොඩ පත්තු සහ ගඟබොඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

1973 සැප්තැබර් මස 20 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. අංක 573,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

9-881—73.09.28 දින අංක 79 දරන ගැසට් පත්‍රය

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1973 අංක 455**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පවත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පංතියේ I වැනි ශ්‍රේණියේ, බී. අළුවිහාරේ මහතා 1973. 04. 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පංතියේ I වැනි ශ්‍රේණියේ, වී. සී. බී. උනන්තැන්න මහතා 1973. 04. 02 වැනි දින සිට වැඩබලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් සහ 1973. 04. 09 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ආයතන අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පංතියේ II වැනි ශ්‍රේණියේ, එම්. ඩබ්ලිව්. එස්. ගුණරත්න මහතා 1973. 04. 02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අතිරේක නිරවුල් කිරීමේ නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩබ්ලිව්. තිලකරත්න මහතා 1973. 01. 01 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, වී. ඇල්. සී. පීටර්ස් මහතා 1973 01. 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ආර්. මහඉහාදු මහතා 1973. 01. 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආනයන හා අපනයන නියෝජ්‍ය පාලකවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පංතියේ පී. ඒ. අබේවික්‍රම මහතා 1973. 01. 11 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එම්. ඒ. එල්. එස්. එන්. මුණසිංහ මහතා 1973. 02. 05 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජ්‍යෙෂ්ඨ සහකාර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඇස්. සී. මානිකවාසගර් මහතා 1973. 02. 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික් කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එච්. ඒ. පී. අබේවර්ධන මහතා 1973. 04. 11 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, කේ. ඒ. කරුණාරත්න මහතා 1973. 02. 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ජී. බී. උමගිලිය මහතා 1973. 02. 19 වෙනි දින සිට නැවත නියමයක් කරන තුරු නියෝජ්‍ය තේ පාලක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එම්. ඊ. එල්. ප්‍රනාන්දු මහතා 1973.03.01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජ්‍යෙෂ්ඨ සහකාර ධීවර අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එල්. එන්. ටී. මෙන්ඩිස් මහතා 1973. 03. 01 වැනි දින සිට 1973. 03. 31 වැනි දින දක්වා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන පාලනයේ සේවයේ II වැනි පන්තියේ, එස්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා මහතා 1973. 05. 18 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ටී. තිරුලිංග නාදන් මහතා 1973. 05. 18 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එස්. එම්. තියෝපිලස් මහතා 1973. 06. 11 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අධිකරණ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ, කේ. ජී. පෙරේරා මහතා 1973 (6. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. එම්. ටී. ආටිගල මහතා 1970. 05. 31 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු පළාත් පාලන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. සී. ද අල්විස් මහතා 1971. 10. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. බී. රාජපක්ෂ මහතා 1972. 06. 06 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර ධීවර අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. පී. ඒ. ජයවර්ධන මහතා 1972. 09. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. ජී. එලිය තම්බි මහතා 1972. 10. 25 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ඉඩම් සංවර්ධන නිලධාරියෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වී. සී. වර්ණකුලසූරිය මහතා 1972. 10. 31 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මොණරාගල පාලන දිස්ත්‍රික්කයේ බිත්තැන්න පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. ආර්. ගලගොඩ මහතා 1973. 02. 06 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මොණරාගල පාලන දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. ආර්. කරුණාරත්න මහතා 1973. 01. 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහණ සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. ඇස්. වීරරත්න මහතා 1973. 01. 19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. කරුණා රත්න මහතා 1973. 01. 17 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජාතික නිවාස සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. එච්. සී. ප්‍රනාන්දු මහතා 1973. 01. 23 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අම්පාර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ. පී. කේ. රොඩ්රිගු මහතා 1973. 01. 29 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මොණරාගල පාලන දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, සී. ඩී. දසනායක මෙනෙවිය 1973. 02. 01 දින සිට නැවත නියමයක් කරනතුරු කුඩා කර්මාන්ත සහකාර අධ්‍යක්ෂවරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. පී. එස්. ජයවර්ධන මහතා 1973.02.01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. වී. මහාදේව මහතා 1973.02.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. ආර්. දාබරේ මහතා 1973.02.26 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කුඩා කර්මාන්ත සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. අල්ගම මහතා 1973.03.10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. අන්තෝනිමුත්තු මහතා 1973.03.20 දින සිට නැවත නියමයක් කරන තුරු මඩකලපුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. මාරිමුත්තු මහතා 1973.05.02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා 1973.02.10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආනයන හා අපනයන සහකාර පාලකවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඇස්. ෂන්මුග සුන්දරම් මහතා 1973.02.21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ දූපත් හි ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. කඩරාජා මහතා 1973.02.21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු යාපනය දිසාපති කාර්යාලයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, සී. ඒෆ්. සී. ද සිල්වා මහතා 1973.02.27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර විභාග කොමසාරිස් (පරිපාලක) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. සී. ආර්. ගුණතිලක මහත්මිය 1973.03.08 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමාජ සේවා සහකාර අධ්‍යක්ෂවරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. කුමාරසිංහ මහතා 1973.03.01 වැනි දින සිට 1973.03.09 වැනි දින දක්වා විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. කුණරාසා මහතා 1973.03.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වවුනියා පරිපාලන දිස්ත්‍රික්කයේ වෙන්ගල චෙඩ්ඩිකුලම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. ජී. විජය තිලක මහතා 1973.03.15 දින සිට නැවත නියමයක් කරනතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එන්. එච්. ඩී. සිල්වා මහතා 1973.03.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. සෝම සුන්දරම් මහතා 1973.03.15 වැනි දින සිට අනුරාධපුර කච්චේරියට අනුයුක්තව සිටීමට සහ, 1973. 05. 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ (මහජන සම්බන්ධතා) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. එම්. අබේසිංහ මහතා 1973.03.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කට යුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. ඩී. අමරසිංහ මහතා 1973.03.22 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. ඇම්. බී. මාරපන මහතා 1973.03.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. බී. රණතුංග මහතා 1973. 03. 24 දින සිට නැවත නියමයක් කරන තුරු කෘෂිකර්ම හා නි77 ය ජජ ජ යය ලලයලයයල යෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. ඩී. චන්ද්‍රදාස මහතා 1973.03.28 වැනි දින සිට 1973.05.01 වැනි දක්වා ත්‍රිකුණාමලය කච්චේරියට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. ඒ. ජයසිංහ මහතා 1973. 03. 28 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සංවර්ධන අංශයේ නියෝජ්‍ය ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරයෙකු වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. ඒ. ඩබ්ලිව්. ජයසේකර මහතා 1973. 03. 30 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඇස්. අබේසිංහ මහතා 1973. 05. 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ දකුණු නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. ඩී. චන්ද්‍රදාස මහතා 1973. 05. 02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ සේරුවිල ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. ඇස්. ඇම්. ද කොස්තා මහතා 1973. 05. 02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සේවක කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජේ. එච්. ඊ. බණ්ඩාර මහතා 1973. 04. 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඊ. බී. අබේසේකර මහතා 1973. 04. 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. වීරසේකර මහතා 1973. 04. 04 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සහකාර ධීවර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. වී. ජේ. විතාරණ මහතා 1973.04.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩී. සී. පී. ජොන්ස් මහතා 1973. 05. 02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. සෝමසුන්දරම් මහතා 1973. 05. 04 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහණ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. දිසානායක මහතා 1973.05.05 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජනතා කමිටු දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. මහාදේව මහතා 1973.05.21 වැනි දින සිට 1973.06.15 වැනි දින දක්වා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. එච්. බී. විජේසූරිය මහතා 1973. 06. 01 දින සිට නැවත නියමයක් කරන තුරු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. එන්. මානික්කනබරාසා මහතා 1973.06.16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පරිවාස හා ළමාරක්ෂක සේවා සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, බී. ඒ්ෆ්. ඒ. රණසිංහ මහතා 1973.05.21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. වී. එස්. ද සොයිසා මහතා 1973. 05. 21 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. ඩබ්ලිව්. පී. සන්දරසාගර මහතා 1973. 05. 21 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. මහාදේව මහතා 1973.06.16 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු රාජ්‍ය භාෂා සහකාර කොමසාරිස්වරයකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. ඩබ්ලිව්. ජී. එම්. ඩබ්ලිව්. ඒකනායක මහතා 1973. 01. 06 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. කුමාරසිංහ මහතා 1973. 03. 10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ජනතා කමිටු සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වී. එස්. එස්. ඔගස්ටින් මහතා 1973. 03. 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මන්නාරම කච්චේරියට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වී. ඩී. එස්. ගුණවර්ධන මහතා 1973. 05. 04 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මහනුවර පාලන දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ආර්. එම්. එස්. බී. රුලපනාව මහතා 1973. 02. 12 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දිස්ත්‍රික් ඉඩම් නිලධාරියෙකු වශයෙන්.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 19 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

9-841—1973. 09. 21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 456**

අංකය : ඊබී/ඒ-3.

පහත සඳහන් පත්වීම් කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා සතුටු වී ඇත :—

කොළඹ පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්ත එම්. ඒ. පී. සමරසේකර මහතා, කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බලන කල්හි, 1973 ජූලි මස 3 වැනි දින සිට 1973 අගෝස්තු මස 20 වැනි දින දක්වා ස්වකීය රාජකාරිවලට අතිරේකව කළුතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රෝල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

කළුතර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත පී. ජී. පුංචිහේවා මහතා, 1973 අගෝස්තු මස 21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව කළුතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රෝල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

පී. එච්. සිරිවර්ධන,
ලේකම්.

1973 සැප්තැම්බර් මස 10 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.

9-714 —1973. 09. 28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්.සී.—බී. 73/52.

**විනිමය පාලන පනත**

1971 අංක 17 දරන පනතින් සංශෝධිත (423 වැනි අධිකාරිය වන) විනිමය පාලන පනතේ 6 (1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමය.

ඇන්. ඇම් පෙරේරා,
මුදල් අමාත්‍යවරයා.

1973 සැප්තැම්බර් 15 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

(1) (423 වැනි අධිකාරය වන) විනිමය පාලන පනතේ 6 වැනි වගන්තිය අදාළ වන විදේශ විනිමය, පහත සඳහන් රටවලින් යම් රටක ව්‍යවහාර මුදලින් ප්‍රකාශිත විදේශ විනිමය විය යුතු ලෙස මෙයින් නියම කරනු ලැබේ :—

ඕස්ට්‍රේලියාව
ඔස්ට්‍රියාව
කැනඩාව
ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව
ප්‍රංශය
හොංකොං
ඉතාලිය
මලයාසියාව
නෙදර්ලන්තය
සිංගප්පූරුව
ස්විට්සර්ලන්තය
එක්සත් රාජධානිය
ඇමෙරිකා එක්සත් ජනපදය
ජපානය
ස්වීඩනය

(2) 1972 මාර්තු 03 වැනි දින අංක 15,000 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද (423 වැනි අධිකාරය වන) විනිමය පාලන පනතේ 6 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

9-843 —1973. 09. 28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත

1964 අංක 44 හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තිය යටතේ නාවික කටයුතු සහ සංචාරක කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

පී. බී. ජී. කලුගල්ල,
නාවික කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1973 සැප්තැම්බර් මස 17 වන දින,
කොළඹ දීය.

ආඥාව

1964 අංක 44 දරණ පනතින් හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ කාර්යයන් සඳහා මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම් ප්‍රමාණය අභය භූමියක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපලේඛනය

කුඩුම්බිගල අභය භූමිය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම පත්තුවේ පිහිටියාවූද, ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් වර්ග සැතපුම් 17ක් වූද පහත සඳහන් පරිදි මායිම්ව ඇත්තාවූද මුළු බිම් ප්‍රමාණය:

ලෙනමආර ආරම්භක ලක්ෂය හමුවන තෙක්, යාල නැගෙනහිර ජාතික වනෝද්‍යාන මායිමේ උතුරු කෙළවර ලක්ෂ්‍යය වූ කුරුඳුල් පොත ත්‍රිකෝණමිතික ලක්ෂ්‍යයේ සිට අඳින ලද රේඛාවකින් ඊශාන දෙසටද, එතැන් සිට හෙලම ආර හමුවන තෙක් ලෙනම ආර දකුණු ඉවුර ඔස්සේ ඊශාන දෙසටද, එතැන් සිට හෙලම කලපුවට බටහිරින් හෙලම එළිය සිට පානම දක්වා වැටී ඇති කරත්ත පාර හමුවන තෙක් හෙලම ආරේ දකුණු ඉවුර ඔස්සේ නැගෙනහිර දෙසට හා ගිණිකොන දෙසටද, එතැන් සිට යාල පානම කරත්ත පාර හමුවන තෙක් දකුණු දෙසට හා ගිණිකොන දෙසටද, එතැන් සිට එම කරත්ත පාරේ පෙර කී ලක්ෂ්‍යයේ සිට හෙලම් කලපුව හමුවන තෙක් යාල පානම කරත්ත පාර ඔස්සේ උතුරු දෙසට හා ඊශාන දෙසටද, එතැන් සිට ඕකන්දවර බොක්කෝ දී මුහුද හමුවන තෙක් දිය ඉවුර ඔස්සේ ගිණිකොන දෙසටද, එතැන් සිට යාල නැගෙනහිර ජාතික වනෝද්‍යානයේ නැගෙනහිර මායිම හමුවන කිරිගල්ල බොක්ක දක්වා මුහුදු වෙරළ ඔස්සේ දකුණු දෙසටද, එතැන් සිට එෆ්.පී.පී. 10 බටහිර මායිම වූද පෙර කී මායිම ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය හමුවන තෙක් වයඹ දෙසටද වේ.

9–707—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වැනි වගන්තිය සමග කියවෙන එහි 115 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ දක්වා ඇති රාජ්‍ය නිලධාරියා හට, I වැනි තීරුවේ දක්වා ඇති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති රාජ්‍ය නිලධාරීන් පත් කිරීම පිළිබඳ බලතල මෙයින් පවරා දෙමි. පත් කිරීම සම්බන්ධයෙන්, රුපියල් 6,720 කට අඩු ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුප් ප්‍රමාණයක් හිමි නිලධාරීන් හට පමණක් මෙම බලතල බලපාන අතර, පත් කිරීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් ගැනෙන ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් කෙරෙහි මෙම බලතල වලංගු නොවේ.

2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120 (3) වැනි වගන්තිය සමග කියවෙන එහි 120 (2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ දක්වා ඇති රාජ්‍ය නිලධාරියා හට, I වැනි තීරුවේ දක්වා ඇති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති රාජ්‍ය නිලධාරීන් මාරු කිරීම පිළිබඳ බලතල මෙයින් පවරා දෙමි. මෙම බලතල පැවරීමේදී මාරු කිරීම යනුවෙන් අදහස් කෙරෙනුයේ, අදාල දෙපාර්තමේන්තුව ඇතුළත කෙරෙන මාරු කිරීම්ය.

3. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය සමග කියවෙන එහි 118 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, රුපියල් 6,720 කට අඩු ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි රාජ්‍ය නිලධාරීන් සේවයෙන් පහකිරීම හා විනයානුකූල පාලනය පිළිබඳ බලතල කලින් තිබුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවැනි බලතල පවරනු ලැබූ නිලධාරීන් හට මෙයින් පවරා දෙමි.

උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|
| කම්කරු අමාත්‍යාංශය | ලේකම්, කම්කරු අමාත්‍යාංශය |
| කම්කරු දෙපාර්තමේන්තුව | කම්කරු කොමසාරිස් |

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මාර්තු මස 15 දින,
කොළඹ 5,
කම්කරු අමාත්‍යාංශයේදීය.

9–681—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතෙහි 78 වන හා 96 වන වගන්ති යටතේ නාවික හා සංචාරක කටයුතු අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව ලංකා සංචාරක මණ්ඩලය විසින් පනවනු ලැබූ නියෝග.

ධර්මසිරි සේනානායක,
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

1973 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹදීය.

නියෝග

ලුහුඬු නාමය.

1. මේ නියෝග 1973 දේශාටන නියෝජිතයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහය යනුවෙන් හඳුන්වනු ලැබේ.

දේශාටන නියෝජිතයන් ලියාපදිංචි කොට ඔවුනට බලපත්‍ර දිය යුතු බව.

2. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍ය්‍යයන් සඳහා හා ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් නියම කොට ගැසට් පත්‍රයෙන් නිවේදනය කළ හැකි යම් දිනයකදී හා ඉන්පසුව, එවකට ස්වකීය ව්‍යාපාරය මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ ලියාපදිංචි කොට බලපත්‍ර ලබාගෙන ඇතහොත් මිස කිසිම තැනැත්තකු විසින් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතුය.

(2) (1) වන ඡේදයෙහි විධිවිධාන කඩ කරමින් දේශාටන නියෝජිත ව්‍යාපාර කාර්‍ය්‍යයන් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කළ හොත් ඒ ස්ථානයේ පදිංචිකරු හෝ අයිතිකරු හෝ එවකට ඒ ව්‍යාපාරය භාරව සිටින තැනැත්තා හෝ වරදක් කරන්නෙක් වන්නේය.

ලියාපදිංචි කිරීම

දේශාටන නියෝජිතයන් ලියාපදිංචි කිරීම හා වර්ග කිරීම සඳහා තිබිය යුතු අවම අවශ්‍යතා.

3. සුදුසු යයි නිසි බලධරයා සලකන, දේශාටන ව්‍යාපාරයේ නියුක්ත මණ්ඩල හෝ පුද්ගලයන් විමසා, දේශාටන නියෝජිත ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා තිබිය යුතු අවම අවශ්‍යතා, ගැසට් පත්‍රයේ පළ කෙරෙන නිවේදනයක් මගින් නිසි බලධරයා විසින් කලින් කල නියම කළ හැකිය. එක් එක් පංතියේ දේශාටන නියෝජිත ව්‍යාපාර පංති සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි එකිනෙකට වෙනස් අවම අවශ්‍යතා නියම කළ හැකිය. යටකී අන්දමේ නිවේදනයක් සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම, නිසි බලධරයා විසින් එවැනිම නිවේදනයක් මගින් කළ හැකිය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

4. (1) දේශාටන නියෝජිතයකු වශයෙන් යම් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම—

(අ) නිසි බලධරයා වෙත ලියවිල්ලකින් කළ යුතුය ;

(ආ) ඒ කාර්‍ය්‍යය සඳහා ඒ බලධරයා විසින් සපයනු ලබන ආකෘතියක් අනුව කළ යුතුය ;

(ඇ) ඒ ආකෘතියෙන් නියම කෙරෙන විස්තර ඇතුළත් වූවක් විය යුතුය ;

(ඈ) ඒ ව්‍යාපාරයේ අයිතිකරු විය යුතු ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතුය.

(2) දේශාටන නියෝජිතයකුගේ කිසිම ව්‍යාපාරයක් නිවේදිත උචිත ගාස්තුව ගෙවනු ලැබූ විටක හැර ලියාපදිංචි නොකළ යුතුය.

දේශාටන නියෝජිතයන්ගේ ලේඛනය

5. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍ය්‍යයන් සඳහා නිසි බලධරයා විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර දේශාටන ව්‍යාපාර සම්බන්ධයෙන් විස්තර ලියාපදිංචි කිරීම සඳහා ‘ දේශාටන නියෝජිතයන්ගේ ලේඛනය ’ යනුවෙන් හැඳින්වෙන ලේඛනයක් තමා නිශ්චය කරන ආකෘතියකට අනුව ආරම්භ කොට පවත්වාගෙන යා යුතුය. නැතහොත් ආරම්භ කොට පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය.

ලියාපදිංචි කිරීම හා වර්ග කිරීම.

6. (1) 8 වන නියෝගයේ අන් ලෙසකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක හැර, 4 වන නියෝගයේ විධිවිධාන යටතේ ඉල්ලීමක් ලැබුණු විටකදී, නිසි බලධරයා විසින් එය නිසි පරිදි සැලකිල්ලට භාජනය කිරීමෙන් පසු—

(අ) ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරය ලියාපදිංචි කොට 3 වන නියෝගය යටතේ නියමිත අවම අවශ්‍යතා අනුව ඒ ව්‍යාපාර යට පංතියක් නියම කළ යුතුය ;

(ආ) ඉල්ලුම්කරු ව්‍යාපාරයේ අයිතිකරු වශයෙන් ලියාපදිංචි කළ යුතුය ;

(ඇ) තත් කාර්‍ය්‍යය සඳහා නියමිත යම් ආකෘතියක් අනුව වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම්කරුට නිකුත් කළ යුතුය.

ඒ ලියාපදිංචි කිරීමේ සහතිකයේ—

(i) මේ සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම සහතික කිරීම සඳහාද,

(ii) 3 වන නියෝගය යටතේ නියමිත අවම අවශ්‍යතාවලට නොඅඩු අවශ්‍යතා ඉටු කරමින් ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරය කටයුතු කරන බව සුරක්ෂිත කිරීම සඳහාද

අවශ්‍ය යයි නිසි බලධාරියා සලකන නියම හෝ කොන්දේසි ඇතුළත් විය හැකිය.

(i) දේශාටන නියෝජිත ව්‍යාපාරයෙහි අයිතිකරු වශයෙන් මේ නියෝගය යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි ‘‘ ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරු ’’ යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) මේ නියෝගය යටතේ ලේඛනයෙහි කරනු ලබන සෑම සටහනක්ම ‘‘ ලියාපදිංචි කිරීමේ සටහනක් ’’ යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(4) දේශාටන නියෝජිත ව්‍යාපාරය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකය, ලියාපදිංචි කරනු ලැබූ තම ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක සවි කොට තැබීම, දේශාටන නියෝජිත ව්‍යාපාරයෙහි අයිතිකරු වශයෙන් එවකට ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම වන්නේය.

ඇතැම් අවස්ථාවලදී තාවකාලිකව ලියාපදිංචි කිරීම.

7. නිසි බලධරයා විසින් දේශාටන නියෝජිතයකුගේ ව්‍යාපාරය ලියාපදිංචි කරන අවස්ථාවේදී ඔහු විසින් නියම කරනු ලබන නියම හා කොන්දේසි යටතේ එය තාවකාලිකව ලියාපදිංචි කළ හැකිය.

ලියාපදිංචි කිරීමට ප්‍රතික්ෂෙප කිරීම.

8. (1) පහත දැක්වෙන හේතුවලින් යම් හේතුවක් මත දේශාටන නියෝජිත ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම නිසි බලධරයා විසින් ආඥාවක් මගින් ප්‍රතික්ෂෙප කළ හැකිය. එනම් :—

(අ) 3 වන නියෝගය යටතේ නිසි බලධරයා විසින් නියම කරන ලද අවම අවශ්‍යතා අනුගමනය නොකිරීම ;

(ආ) ඉල්ලුම්කරු හෝ දේශාටන නියෝජිත ව්‍යාපාරයේ ඔහු විසින් සේවයෙහි යොදවනු ලැබූ හෝ සේවයෙහි යෙදවීමට බලාපොරොත්තු වූ යම් තැනැත්තකු, ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කළ දිනයට පෙරාතුවම වූ අවුරුදු පහක කාලසීමාව තුළ, මුදල් නීති පනත, විනිමය පාලන පනත, 1968 අංක 28 දරණ විදේශ විනිමය හිමිකම් සහතික පනත, රේගු ආඥාපනත, හෝ ආනයන හා අපනයන පාලන පනත යටතේ කළ වරදක් සම්බන්ධයෙන් හෝ ඒ ව්‍යාපාර ස්ථානය නීති විරෝධී කාර්‍ය්‍යයන් සඳහා පාවිච්චි කිරීම හා සම්බන්ධ වරදක් හෝ චරිත දූෂණය ඇතුළත් වන වරදක් හෝ සම්බන්ධයෙන් වරදකරු වීම ;

(ඇ) දේශාටන නියෝජිත ව්‍යාපාරයේ පිහිටීම, නිර්මාණය, සෞඛ්‍ය, ඉඩ පහසුකම්, කාර්‍ය්‍ය මණ්ඩලය හෝ උපකරණ හා සම්බන්ධ හේතු.

(2) (1) වන ඡෙදයෙහි විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂෙප කරමින් නිසි බලධරයා විසින් කරන ලද සෑම නියමයකම, ඒ නියමය කිරීමට තුඩු දුන් හේතුද ඇතුළු විය යුතුය.

(3) යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහාවූ ඉල්ලීමක් ප්‍රතික්ෂෙප කරමින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, ප්‍රතික්ෂෙප කිරීමේ හේතු සමඟ ඒ ආඥාවේ සහතික පිටපතක් නිසි බලධරයා විසින් ඉල්ලුම්කරු වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය.

(4) ඉල්ලුම්කරු විසින් සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකු මේ නියෝගයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමේ හේතුව පිට දේශාටන නියෝජිත ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂෙප කිරීමේදී, ඒ සේවකයා විසින් ඒ වරද කරන ලද්දේ ඉල්ලුම්කරුගේ අනුදැනීමක් නොමැතිව බවට හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා හැකි සෑම උද්යෝගයක්ම තමා විසින් යොදවන ලද බවට හෝ, ඒ ඉල්ලුම්කරු විසින්, නිසි බලධරයා සෑහීමට පත්වන අයුරු ඔප්පු කළහොත් එකී ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂෙප කිරීමේ නියමයක් නොකළ යුතුය.

(5) යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂෙප කිරීමේ නියමයක් කිරීමට පෙර ඉල්ලුම්කරුට තමා විසින්ම හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නියෝජිතයකු මාර්ගයෙන් හෝ කරුණු කියා සිටීමට අවස්ථාවක් නිසි බලධරයා විසින් සලසා දිය යුතුය.

ලියාපදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

9. (1) නිසි බලධරයා විසින්, යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම—

(අ) 8 (1) (අ) හා (ඇ) නියෝගයෙහි නියමිත හේතුවලින් යම් හේතුවක් නිසා ;

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් කඩ කිරීමේ හේතුවෙන් පනත යටතේ සිදු කරනු ලැබූ යම් වරදක් හෝ මුදල් නීති පනත, විනිමය පාලන පනත, 1968 අංක 28 දරණ විදේශ විනිමය හිමිකම් සහතික පනත, රේගු ආඥාපනත හෝ ආනයන අපනයන පාලන පනත හෝ යටතේ කළ වරදක් සම්බන්ධයෙන් දේශාටන නියෝජිත ව්‍යාපාරයෙහි ලියාපදිංචි අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් සේවකයකු හෝ වරදකරු කිරීම නිසා හෝ දේශාටන නියෝජිත ව්‍යාපාරය නීති විරෝධී කාර්‍ය්‍යයක් සඳහා යොදවා ගැනීම සම්බන්ධයෙන් නැතහොත් චරිත දූෂණයට අදාල වරදක් සම්බන්ධයෙන්, ලියාපදිංචි අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් සේවකයකු වරදකරු කිරීම නිසා ;

(ඇ) දේශාටන නියෝජිත ව්‍යාපාරය සඳහා යොදවා ගනු ලැබූ ගොඩනැගිල්ල හෝ ඒ ගොඩනැගිල්ලෙහි යම් කොටසක් නියම බලධාරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව ඒ දේශාටන නියෝජිත ව්‍යාපාර කාය්‍ය්‍ය නොවන වෙනයම් කාය්‍ය්‍යක් සඳහා යොදවාගනු ලැබීම නිසා හෝ පාවිච්චි කරනු ලැබීම නිසා ;

(2) වන ඡෙදයේ විධිවිධානවලට යටත්ව ආඥාවක් මගින් අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකිය.

දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි කිරීම අත්හිටුවමින් හෝ අවලංගු කරමින් නිසි බලධරයා විසින් කරන ලද සෑම නියමයකම, ඒ නියමය කිරීමට තුඩු දුන් ඔහුගේ හේතුද ඇතුළු විය යුතුය.

(2) ලියාපදිංචි කළ අයිතිකරු විසින් සේවයේ යොදවන ලද තැනැත්තකු මේ නියෝගයේ සඳහන් යම් වරදක් කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබීමේ හේතුව පිට ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීම අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ කිසිදු නියමයක්, තම සේවකයා විසින් ඒ වරද කරන ලද්දේ තම අනුදැනීමෙන් තොරව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා නියියාකාරව සම්පූර්ණ උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව හෝ එකී ලියාපදිංචි කළ අයිතිකරු විසින් නිසි බලධරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, නොකළ යුතුය.

(3) දේශාටන නියෝජිත යම් ව්‍යාපාරයක ලියාපදිංචි කිරීම අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයක් කිරීමට පෙර, ලියාපදිංචි අයිතිකරුට, තමා විසින්ම හෝ ඒ සඳහා ඔහු ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ, කරුණු කියා සිටීමට අවස්ථාවක්, නිසි බලධරයා විසින් සලසා දිය යුතුය.

(4) දේශාටන නියෝජිත ව්‍යාපාරයේ ලියාපදිංචි අයිතිකරු වෙත නිසි බලධරයා විසින් ලියාපදිංචි තැපැලෙන් යවන ලද ලිඛිත දැන්වීමක් මගින්, ඒ බලධරයා විසින් නියම කරනු ලබන පියවර ඒ දැන්වීමෙහි නියමිත කාලසීමාව තුළ ඒ අයිතිකරු විසින් නොගනු ලැබුවහොත් ඒ දැන්වීමෙහි නියමිත කාලසීමාව ඉකුත්වූ විට, ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීම අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයක් කරන බව දැනුම් දුනහොත් සහ එසේ නියමිත කාලසීමාව ඉකුත්වීමට පෙර, ඒ පියවර ගැනීමට ඒ අයිතිකරු අපොහොසත් වුවහොත් මිස, (1) වන ඡෙදය යටතේ දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි කිරීම අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ කිසිම නියමයක් නොකළ යුතුය.

(5) දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි කිරීම අත් හිටුවන හෝ අවලංගු කරන නියමයක් කරනු ලැබූ අවස්ථාවක ඒ නියමය කිරීමට තුඩුදුන් හේතු ඇතුළත් ඒ නියමයේ සහතික පිටපතක්, නිසි බලධරයා විසින්, ලියාපදිංචි අයිතිකරු වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය.

දේශාටන නියෝජිතයන් වර්ග කිරීම පරිශෝධනය කිරීම.

10. (1) දේශාටන නියෝජිත ව්‍යාපාරයක් විසින් එවකට පවත්වාගෙන යනු ලබන තත්ත්වය අනුව ඒ ව්‍යාපාරයට දෙනු ලැබූ වර්ග කිරීම නිසි බලධරයා විසින් අවස්ථානුකූලව සුදුසුයයි සලකන විමර්ශන පැවැත්වීමෙන් පසුව හා ලියාපදිංචි අයිතිකරුට කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසුව, නිසි බලධරයා විසින්, නියමයක් මගින්, කලින් කළ වෙනස් කිරීම හෝ සමීක්ෂණ කිරීම හෝ කළ හැකිය. නිසි බලධරයා විසින් කරනු ලැබූ එවැනි සෑම නියමයකම ඒ නියමය කිරීමට තුඩුදුන් ඔහුගේ හේතු ඇතුළු විය යුතුය.

(2) මේ නියෝගය යටතේ කරනු ලැබූ සෑම නියමයක සහතික පිටපතක්, ඒ නියමය කිරීමට තුඩුදුන් හේතු සමඟ, ලියාපදිංචි අයිතිකරු වෙත නිසි බලධරයා විසින් ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය.

## බලපත්‍ර දීම

බලපත්‍ර දීම.

11. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලියාපදිංචි කරනු ලැබූ කිසිදු දේශාටන නියෝජිතයකු විසින්, මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ඒ ව්‍යාපාරය ලියාපදිංචි කරනු ලැබූ දිනයේ සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත්වූ විට හා ඉන් පසුව ඒ ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාම නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබ එවකට බලපවත්වන්නාවූ බලපත්‍රයක නියම හා කොන්දේසි වල අධිකාරය යටතේ හා ඒවා අනුව මිස නොකළ යුතුය.

(2) මේ නියෝගයේ විධිවිධානවල යම් කඩකිරීමක් හේතුකොටගෙන පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාරයේ ලියාපදිංචි අයිතිකරු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය.

(3) (අ) ලියා පදිංචි කරනු ලැබූ දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම—

(i) නිසි බලධරයා වෙත ලියවිල්ලකින් කළ යුතුය ;

(ii) ඒ කාර්යය සඳහා නිසි බලධරයා විසින් සැපයිය හැකි ආකෘති පත්‍රයක් මගින් කළ යුතුය ;

(iii) ඒ ව්‍යාපාරය හා සම්බන්ධ ලියාපදිංචි කිරීමේ සටහනෙහි සඳහන් වන්නාවූ තොරතුරු ඇතුළු, ඒ ආකෘති පත්‍රය මගින් සැපයිය යුතු යයි නියමිත තොරතුරු ඇතුළත් විය යුතුය ;

(iv) ඒ ව්‍යාපාරයෙහි ලියාපදිංචි අයිතිකරු විසින් අත්සන් කළ යුතුය.

(ආ) යම්කිසි වර්ෂයක් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම ඒ කාර්යය සඳහා සපයනු ලබන ආකෘති පත්‍රය මගින් නිසි නිවේදිත ගාස්තුව සමඟ, ඒ බලපත්‍රයෙහි කාලය ඉකුත් වන දිනයට යටත් පිරිසෙයින් දින තිහකට කලින් නිසි බලධරයාට ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

(4) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතෙහි දෙනු ලැබූ බලපත්‍රයක් සාමාන්‍ය බලපත්‍රයක් හෝ තාවකාලික බලපත්‍රයක් විය හැකිය.

(5) සෑම සාමාන්‍ය බලපත්‍රයක් හා බලපත්‍රයක සෑම අලුත් කිරීමක්ම එහි නිශ්චිතව සඳහන් දිනයේ සිට බලපවත්වන අතර. එය නිසි බලධරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එකී දිනයේ සිට දොළොස් මසක කාල සීමාවක් සඳහා බල පැවැත්වේ,

නිසි බලධරයා විසින් තාවකාලික බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව සඳහා පමණක් සෑම තාවකාලික බලපත්‍රයක්ම වලංගු විය යුතු අතර, ඉන් ඉදිරියට එය වලංගු නොවන්නේය.

(6) නිසි නිවේදිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් මිස, කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(7) නිසි බලධරයා විසින් ව්‍යාපාරය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ලියාපදිංචි අයිතිකරු විසින් තම ව්‍යාපාර ස්ථානයෙහි ප්‍රකට තැනක ප්‍රදර්ශනය කළ යුතුය.

(8) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරනු ලැබූ කිසිම බලපත්‍රයක් අන් තැනැත්තකු වෙත පැවරිය නොහැකි වන අතර, ඒ අනුව, එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේය.

12. (1) බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්ද ඒ ව්‍යාපාරය මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධි විධාන යටතෙහි ලියාපදිංචි නොකරනු ලැබුවේ නම් ;

(2) බලපත්‍රය ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් වර්ෂයක් සම්බන්ධයෙන්ද, ඒ වර්ෂයට පෙරාතුවම වූ වර්ෂය සඳහා නිසි බලධරයා විසින් ලියා පදිංචි අයිතිකරු වෙත නිකුත් කරන ලද බලපත්‍රයෙහි නියම හා කොන්දේසි අනුව ක්‍රියා කිරීම ඒ අයිතිකරු පැහැර හැර තිබේ නම් ;

(3) ඉල්ලීම ඉදිරිපත් කරන්නේ යම් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ වර්ෂයට පෙරාතුවම වූ වර්ෂය තුළ ලියා පදිංචි අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යමෙකු මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි යම් විධි විධානයක් කඩකිරීමේ හේතුවෙන් පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මුදල් නීති පනත හෝ 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත, විනිමය පාලන පනත, රේගු ආඥාපනත හෝ ආනයන හා අපනයන පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබුණේ නම් හෝ, ඒ ව්‍යාපාර ස්ථානය නීති විරෝධී කාර්යයක් හෝ චරිත දූෂණයට අදාළ වරදක් සඳහා පාවිච්චි කිරීමේ වරදකට ලියාපදිංචි අයිතිකරු හෝ ඔහුගේ යම සේවකයකු වරදකරු කරනු ලැබ තිබුණේ නම් ;

බලපත්‍රයක් දීම නිසි බලධරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

බලපත්‍රයෙහි නියම හා කොන්දේසි.

13. (1) දේශාටන නියෝජිතයකුගේ ලියා පදිංචි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීම ඒ බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන නියම හෝ කොන්දේසිවලට යටත්ව කළ හැකිය. එසේ නිශ්චිතව නියම කරනු ලබන කොන්දේසි,—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බව සහතික කිරීම සඳහා ; හා

(ආ) ඒ ව්‍යාපාරය අයත් දේශාටන නියෝජිතයන්ගේ පංතියට අදාළ අවම සම්මතවලට නොඅඩු තත්ත්වයෙන් ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම සහතික වශයෙන් ඉටු කරවීම සඳහා අවශ්‍යයයි නිසි බලධරයා විසින් සලකනු ලබන නියම හෝ කොන්දේසි විය හැකිය.

(2) ලියාපදිංචි කරනු ලැබූ යම් දේශාටන නියෝජිතයකුගේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක්, 14 වන නියෝගයේ (6) වන ඡෙදයෙහි විධිවිධානවලට යටත්ව, පහත සඳහන් අවස්ථාවලදී ඒ බලධරයා අත්හිටුවිය හැකිය නැතහොත් අවලංගු කළ හැකිය යන්න ඒ බලපත්‍රයෙහි නියමයක් හෝ කොන්දේසියක් විය යුතුය :—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ යම් විධිවිධානයක් දේශාටන නියෝජිත ව්‍යාපාරයට අදාළ කිරීමේදී එය කඩකිරීමේ හේතුවෙන් පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මුදල් නීති පනත, විනිමය පාලන පනත, 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත, රේගු ආඥාපනත හෝ ආනයන හා අපනයන පාලන පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන්, ලියාපදිංචි අයිතිකරු හෝ ඔහු සේවකයන්ගෙන් යමෙකු වරදකරු කරනු ලැබූ නැතහොත් ඒ ව්‍යාපාර ස්ථානය නීති විරෝධී කාර්යයක් හෝ චරිත දූෂණය පිළිබඳ වරදක් හෝ සඳහා පාවිච්චි කිරීම හා සම්බන්ධ වරදක් සම්බන්ධයෙන් ලියාපදිංචි අයිතිකරු හෝ ඔහුගේ යම් සේවකයකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ;

(ආ) බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක් ඒ අයිතිකරු විසින් කඩ කළ හෝ එය අනුව ක්‍රියාකිරීම පැහැර හැරිය හෝ අවස්ථාවක ;

(ඇ) දේශාටන නියෝජිත ව්‍යාපාරය සඳහා යොදවා ගනු ලැබූ ගොඩනැගිල්ල හෝ ඒ ගොඩනැගිල්ලෙහි යම් කොටසක් නිසි බලධරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව ඒ දේශාටන නියෝජිත ව්‍යාපාර කාර්යය නොවන වෙන යම් කාර්යයක් සඳහා යොදවාගනු ලැබූ හෝ පාවිච්චි කරනු ලැබූ අවස්ථාවක.

(3) දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන බලපත්‍රයකට ඇතුළත් නියමයක් හෝ කොන්දේසියක් නිසි බලධරයා විසින් තමාගේ වුවමනාවෙන් හෝ දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි අයිතිකරු විසින් තමා වෙත කරුණු ඉදිරිපත් කළ විටක හෝ ඒ ලියාපදිංචි අයිතිකරුට කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසුව, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ පරිවර්ජනය කිරීම හෝ එයට අලුත් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීම හෝ කළ හැකිය.

බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

14. (1) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා හෝ ඉල්ලීමක් ලැබීමෙන් පසු, නිසි බලධරයා විසින්, (6) වන ඡෙදයෙහි විධිවිධානවලට යටත්ව, ඒ ඉල්ලීමට ඉඩ දෙමින්, හෝ එය ප්‍රතික්ෂේප කරමින් නියමයක් කළ හැකිය :

එසේ වුවද, බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක නිසි බලධරයා විසින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු තමාගේ නියමයෙහි සඳහන් කළ යුතුය.

(2) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් නිසි බලධරයා විසින් කරනු ලැබූ නියමයක සහතික පිටපතක් ලියාපදිංචි අයිතිකරුට භාරදීමට කටයුතු සැලසිය යුතුය. එසේ ප්‍රතික්ෂේප කිරීමේ නියමය කිරීමට තුඩුදුන් හේතු එවැනි සෑම සහතික පිටපතකම ඇතුළත් විය යුතුය.

(3) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා කරනු ලැබූ ඉල්ලීමකට ඉඩ දෙමින් නිසි බලධරයා විසින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ බලධරයා විසින් නිශ්චය කළහැකි ආකෘතියකට අනුව හා ඔහු විසින් නිශ්චය කළ හැකි විස්තර ඇතුළත් බලපත්‍රයක් ලියාපදිංචි අයිතිකරු වෙත ඔහු විසින් නිකුත් කළ යුතුය.

(4) බලපත්‍රයක ඇතුළත් නියම හෝ කොන්දේසි අනුව ක්‍රියා නොකළහොත් නිසි බලධරයා විසින් නියමයක් මගින් බලපත්‍රය අත්හිටුවිය හැකිය. නැතහොත් අවලංගු කළ හැකිය. මේ ඡෙදය යටතේ කරනු ලැබූ සෑම නියමයකම ඒ නියමය කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතුය.

(5) නිසි බලධරයා විසින් බලපත්‍ර දරන්නා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලබන ලිඛිත දන්වීමක් මගින්, ඒ දන්වීමෙහි ඒ බලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පියවර ඒ බලපත්‍රය දරන්නා විසින් නොගනු ලැබුවහොත් ඒ දන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඉකුත් වීමෙන් පසු එය අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයක් කරන බව දනුම් දුනහොත් සහ, එසේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්වීමට පෙර එකී පියවර ගැනීම බලපත්‍ර දරන්නා පැහැර හැරියහොත් මිස බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයක් නොකළ යුතුය.

(6) බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ නියමයක් කිරීමට පෙර, තමා විසින්ම හෝ තමා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයකු විසින් කරුණු කියා සිටීමට අවස්ථාවක් ලියා පදිංචි අයිතිකරුට නිසි බලධරයා විසින් දිය යුතුය.

(7) බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ නියමයක් කරනු ලැබූ අවස්ථාවක ඒ නියමය කිරීමට තුඩුදුන් හේතු සමඟ එහි සහතික පිටපතක් නිසි බලධරයා විසින් ලියා පදිංචි තැපෑලෙන් ලියා පදිංචි අයිතිකරුවෙත යැවිය යුතුය.

(8) දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තකු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමේ හේතුව පිට ඒ ව්‍යාපාරය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂෙප කරමින් හෝ ඒ ව්‍යාපාරයේ බලපත්‍රය අත්හිටුවමින් හෝ අවලංගු කරමින් හෝ නියමයක් කිරීමේදී, තම සේවකයා විසින් ඒ වරද සිදු කරන ලද්දේ තම අනුදැනීමක් නොමැතිව බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා නිසියාකාරව සම්පූර්ණ උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඒ ව්‍යාපාරයේ ලියාපදිංචි කළ අයිතිකරු විසින් නිසි බලධරයා සෑහීමට පත්වන අයුරු ඔප්පු කළහොත්, එවැනි නියමයක් නොකළ යුතුය.

(9) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක බලපත්‍රය අත්හිටවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රයේ බලපැවැත්ම සියලු කාර්යයන් සඳහා නතරවූ ලෙස සැලකිය යුතුය.

## සාමාන්‍ය කරුණු

ලියාපදිංචි කිරීමේ සටහනෙහි හෝ බලපත්‍රයෙහි තොරතුරු නිවැරදි කිරීම.

15. (i) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි කිරීමේ සටහනෙහි තොරතුරු සංශෝධනය කිරීමක් අවශ්‍ය වන පරිදි ඒ ව්‍යාපාරයට අදළ යම් කරුණක හෝ දෙයක වෙනසක් සිදුවූ කල්හි, ඒ ව්‍යාපාරයේ ලියාපදිංචි අයිතිකරු විසින් ඒ වෙනස එකෙනෙහිම නිසි බලධරයාට දනුම් දිය යුතුය. නිසි බලධරයාට ඒ දන්වීම, ලැබුණු විට අවස්ථාවෝචිත පරිදි සුදුසුයයි ඔහු විසින් සැලකෙන පරීක්ෂණ පැවැත්වීමෙන් පසු, ඒ තොරතුරුවල අවශ්‍ය සංශෝධන කළ හැකිය.

(2) ලියාපදිංචි කළ දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි කිරීමේ සටහනෙහි හෝ බලපත්‍රයෙහි යම් තොරතුරක් නිසි බලධරයා විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ සංශෝධනය කරනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රයෙහි අනුරූප සංශෝධන කිරීම පිණිස ඒ බලපත්‍රය ආපසු එවීමට ඒ බලධරයා විසින් ලියාපදිංචි අයිතිකරුට නියම කළ හැකිය. තවද, එහි නියමිත කාලසීමාව ඇතුළත ඒ නියමය අනුව ක්‍රියාකිරීම ඒ අයිතිකරුගේ යුතුකම වන්නේය.

සංචාරකයින් විසින් දේශාටන නියෝජිතයින්ට ගෙවීමේ ක්‍රමය හා ආකාරය පිළිබඳවද එවැනි ගෙවීම් දේශාටන නියෝජිතයන් විසින් භාරගැනීමේ ක්‍රමය හා ආකාරය පිළිබඳවද විශේෂ විධිවිධාන.

16. (1) යම් ලියා පදිංචි දේශාටන නියෝජිතයකු විසින් සපයනු ලැබූ සේවාවන් සහ පහසුකම් සඳහා සංචාරකයන් විසින් ගෙවීමේ ක්‍රමය හා ආකාරයද එවැනි දේශාටන නියෝජිතයකු විසින් ඒ ගෙවීම් භාරගැනීමේ ක්‍රමය හා ආකාරයද මණ්ඩලයේ අනුමැතිය ඇතිව නිසි බලධාරයා විසින් කලින් කල ඒ කාර්යය සඳහා නිකුත් කරනු ලබන විධානයන් අනුව විය යුතුය.

(2) මේ නියෝගයේ (1) වන ඡෙදය යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරන ලද යම් විධානයක්, මුදල් නීති පනතේ හා/හෝ විනිමය පාලන පනතේ 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනතේ, රේගු ආඥාපනතේ හෝ ආනයන හා අපනයන පාලන පනතේ විධි විධානවලට ද එකී පනත් යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලටද අනුකූල විය යුතුය.

(3) ලියාපදිංචි කළ යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාරයේ ලියාපදිංචි අයිතිකරු හා (1) වන උප වගන්තියේ සඳහන් ගෙවීම ඇත්ත වශයෙන්ම ඉල්ලා සිටි හෝ ඒ ගෙවීම භාරගත් හෝ තැනැත්තා ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය.

වංචනිකව ලියාපදිංචි කිරීම හෝ බලපත්‍ර ලබා ගැනීම හෝ සඳහා දඬුවම.

17. මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලියාපදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබාගත යුතු යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් යම් තැනැත්තකු විසින් අසත්‍ය හෝ වංචනික හෝ නියෝජනය කිරීම් නැතහොත් වෙනත් ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමෙන් හෝ කරවීමෙන් ලබා ගත හොත් හෝ ලබා ගැනීමට ප්‍රයත්න දැරුවහොත් ඒ තැනැත්තා සහ ඔහුට ආධාර හා අනුබල දෙන සෑම තැනැත්තෙක්ම වරදකරුවෙක් වන්නේය.

දේශාටන නියෝජිතයකු වශයෙන් නම ආරූඪකරගැනීම හෝ ව්‍යාපාරය පවත්වාගෙන යාම වරදක් බව.

18. (1) යම් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලියාපදිංචිකොට ඒ සඳහා බලපත්‍රයක් ලබා තිබෙන්නේ නම් මිස, ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරය ලියාපදිංචි කළ හා බලපත්‍ර ලැබූ ව්‍යාපාරයක් බවට හඟවන යම් නමක් අභිධානයක් හෝ අමතර නාමයක් හෝ විස්තරයක් ඒ ව්‍යාපාරයට අදාළව ගැනීම, පාවිච්චි කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම එවැනි ව්‍යාපාරයක් අයිති කිසිවකු විසින් නොකළ යුතුය.

(2) මේ නියෝගයේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තෙක්ම වරදරකැවෙක් වන්නේය.

සාමාන්‍යයෙන් යම්යම් පුද්ගලයන් ගෙන් තොරතුරු ලබාගැනීමට හා පරීක්ෂණ පැවැත්වීමට නිසි බලධරයාට ඇති බලය.

19. (1) නිසි බලධරයා විසින්—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ යම් ඉල්ලීමකට සුදුස්සක්කොට බැහැර කිරීම සඳහා හෝ එබඳු ඉල්ලීමක සඳහන් යම් තොරතුරක නිවැරදි භාවය නැතහොත් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඒ තැනැත්තා විසින් සපයනු ලැබූ යම් වාර්තාවක හෝ තොරතුරක නිවැරදි භාවය සොයා දනගැනීම සඳහා හෝ යම් ලියාපදිංචිකිරීමක් හෝ බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා හෝ අවශ්‍ය තොරතුරු වන්නාවූ ද නියමයෙහි සඳහන් කරනු ලබන්නාවූද තමන් දන සිටින්නාවූ ද තොරතුරු සැපයීමට යම් තැනැත්තකුට නියම කළ හැකිය. තවද,

(ආ) එවැනි යම් කාර්යයක් සඳහා අවශ්‍ය සියලු පරීක්ෂණ කලින් කල පැවැත්විය හැකිය.

(2) මේ නියෝගයෙහි (1) වන ඡෙදය යටතේ යම් විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් නියමිත කාලය ඇතුලත ඒ නියමයන් ඉටුකළ යුතුය.

එසේ වුවද, ඒ විධානය නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුටද, ඒ තැනැත්තාට නොවැළැක්විය හැකි හේතු නිසා ඒ විධානය අනුව ක්‍රියාකළ නොහැකි බවට නිසි බලධාරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ විධානය අනුව ක්‍රියාකිරීම සඳහා ඒ තැනැත්තාට නිසි බලධාරයා විසින් තවදුරටත් කල් දිය හැකිය.

වැරදි.

20. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි යම් විධි විධානයක් කඩ කරමින් ක්‍රියාකරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරද කරුවෙක් වන්නේය.

(2) ලියාපදිංචි දේශාටන නියෝජිත ව්‍යාපාරයක අයිතිකරුවකුගේ සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහයේ යම් විධිවිධානයක් කඩකිරීමේ හේතුවෙන් මේ පනත යටතේ කරනු ලැබූ යම් වරදක්, ඒ ලියාපදිංචි අයිතිකරුගේ දැනුමක් නොමැතිව සිදුකරනු ලැබූ බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීමෙහිලා සම්පූර්ණ උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව නිසි බලධරයා සෑහීමට පත්වන පරිදි ලියා පදිංචි අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද ඒ ලියාපදිංචි අයිතිකරු විසින් සිදුකරනු ලැබූ වරදක් ලෙස සලකනු ලැබේ.

ලියාපදිංචි කරනු ලැබූ හා බලපත්‍ර ලැබූ දේශාටන නියෝජිත ව්‍යාපාර විසින් පොත් හා ලේඛන තැබීමද වාර්තා සැපයීමද කළයුතු බව.

21. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබූ හා බලපත්‍ර ලැබූ දේශාටන නියෝජිත ව්‍යාපාරයක සෑම අයිතිකරුවකු විසින් පහත දක්වෙන තොරතුරු ඇතුළත් පොත් සහ ලේඛන තැබිය යුතුය :—

(අ) ඒ දේශාටන නියෝජිතයාගේ සේවාවන් ලබාගත් තැනැත්තන්ගේ නම, ඒ තැනැත්තාට පිරිනමනු ලැබූ සේවාවල ස්වභාවය හා ඒ සේවය පිරිනමනු ලැබූ කාලසීමාව හෝ දින ,

(ආ) දේශාටන නියෝජිතයාගේ සේවය ලබාගත් තැනැත්තාගේ මුල් රට හා ලිපිනය ,

(ඇ) නවාතැන් පහසුකම්, කෑමබීම, ප්‍රවාහන කුලිය හා වෙනත් සේවා සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් කරනු ලැබූ ගෙවීම් හා ඒ ගෙවීම කරනු ලැබූයේ කවර රටක වංලග්‍ර මුදලින්ද යන වග ,

(ඈ) නිසි බලධරයා විසින් නියම කළ හැකි වෙනත් යම් තොරතුරක්.

(2) දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියාපදිංචි සෑම අයිතිකරුවකු විසින්ම, වාරානුකූලව සහ මණ්ඩලයේ සභාපති, නිසි බලධරයා හෝ ඒ බලධරයා වෙනුවෙන් ක්‍රියා කරන මණ්ඩලයේ නිලධරයකු හෝ විසින් නියම කරනු ලැබූ අවස්ථාවක ඒ ව්‍යාපාරය විසින් පවත්වාගෙන යනු ලබන පොත්වල සහ ලේඛනවල ඇතුළත් තොරතුරුවල සහතික කළ උධෘත හෝ වාර්තා නිසි බලධරයාට යැවිය යුතුය.

ඇතුළුවීම පරීක්ෂා කිරීම ආදිය පිළිබඳ බලතල.

22. (i) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරනු ලබන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා මණ්ඩලයේ සභාපති, මණ්ඩලයේ සභාපතිගේ අධිකාරය යටතේ ක්‍රියාකරන මණ්ඩලයේ සාමාජිකයකු, නිසි බලධරයා හෝ මණ්ඩලයේ සභාපතිගේ හෝ නිසි බලධරයාගේ හෝ ලිඛිත අධිකාරය යටතේ ක්‍රියා කරන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂවරයකුගේ ධුරයට නොඅඩු තත්ත්වයක ධුරයක් දරන්නා වූ යම් තැනැත්තකු හෝ විසින් පහත දක්වෙන කාර්ය කිරීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරනු ලබන හෝ ප්‍රයෝජනයට ගනු ලබන නැතහොත් දේශාටන නියෝජිත ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරනු ලැබේයයි හෝ ප්‍රයෝජනයට ගනු ලැබේයයි හැඟවෙන යම් ස්ථානය කට කලින් දැනුම්දීමක් නොමැතිව ව්‍යාපාර වේලාවන්හි යම් වේලාවක ඇතුළුවීම හා, පනතෙහි හෝ මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන ප්‍රකාර ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබේදැයි සොයා දනගැනීමේ කාර්ය සඳහා ඒ ස්ථානය පරීක්ෂා කිරීම ;

(ආ) දේශාටන නියෝජිත ව්‍යාපාරයක් භාරව සිටින යම් තැනැත්තකුගේ හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් තැනැත්තකුගේ හෝ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි තිබෙන යම් පොතක්, දන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ අන් කිසි ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම් වේලාවක ඒ දේශාටන නියෝජිත ව්‍යාපාරය භාරව සිටින තැනැත්තාට නියම කිරීම ;

(ඇ) එකී පොතක්, දන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ අන් කිසි ලේඛනයක් පරීක්ෂා කිරීම, එකී පොතකින්, දන්වීමකින්, වාර්තාවකින්, ලැයිස්තුවකින් හෝ ලේඛනයකින් පිටපත් ගැනීම හෝ උධෘත ගැනීම, එහි යම් සටහන් පිළිබඳව පැහැදිලි කිරීමක් යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටීම හා තම අදහස පරිදි පනත යටතේ හෝ මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යම් වරදක් පිළිබඳව සාක්ෂි ලබාගත හැකි යයි හැඟෙන එකී පොතක්, දන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ ලේඛනයක් තහනමට ගැනීම ;

(ඈ) තමා ඇතුළුවූ ස්ථානයෙහි දී හමුවන්නාවූ හෝ ඒ ස්ථානයේ සේවය කරතැයි හෝ සේවයකොට ඇතැයි හෝ මේ නියෝගයෙහි සඳහන් යම් දෙයක සන්තකය, භාරය හෝ පාලනය ඇතැයි හෝ විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇත්තාවූ සෑම තැනැත්තකුම, තමාට සුදුසුයැයි හැඟෙන පරිදි, තනිව හෝ අන් තැනැත්තකු ඉදිරියේ ප්‍රශ්න කිරීම,

(ඉ) පෙරාතුවම වූ (ඈ) අනුඡෙදයෙහි සඳහන් යම් තැනැත්තකුට තමා විසින් නියම කරනු ලැබූ වේලාවක හා ස්ථානයකදී තමා ඉදිරියෙහි පෙනී සිටීමට නියම කිරීම හා තමා විසින් විමර්ශනය කරනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාගෙන් ඒ අවස්ථාවේදී එහිදීම ප්‍රශ්න කිරීම.

(2) මේ නියෝගය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ඒ සභාපති විසින්, සාමාජිකයා විසින්, බලධරයා විසින් හෝ තනැත්තා විසින් නියම කරනු ලබන සියලු පහසුකම් (i) වන ඡෙදයෙහි දක්වෙන යම් ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තකු විසින් සියලු විටම සැපයිය යුතුය.

(3) (i) වන ඡෙදයෙන් පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටියහොත් තමා හඳුනා ගැනීමේ සාක්ෂි හෝ කලින් සඳහන් කරනු ලැබූ ලිඛිත බලය හෝ ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කළ යුතුය.

(4) මේ නියෝගයේ පෙරාතුව විධිවිධානවලින් පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේදී එකී සභාපතිට, සාමාජිකයාට, බලධරයාට හෝ තැනැත්තාට විරෝධය පාන හෝ බාධා පමුණුවන යම් තැනැත්තෙක් වරදක් කරන්නෙක් වන්නේය.

(5) (i) වන ඡෙදයේ විධිවිධාන යටතේ ක්‍රියාකරන යම් තැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය අනුව රජයේ සේවකයකු ලෙස සලකනු ලැබේ.

රහස්‍යතා දිවුරුම.

23. 23(2) හා 24(i) වන නියෝගවලින් පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කරන සියලුම තැනැත්තන් එකී නියෝගවල දක්වෙන කාර්ය ඉටුකරන කාලය තුළ හා ඉටු කිරීමේදී තමන්ට හෝ ඔවුන්ට දැනගන්ට ලැබෙන හෝ දැනගන්නට ලැබිය හැකි යම් සිද්ධියක්, කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහු හෝ ඔවුන් විසින් දැඩි රහස්‍යතාව ආරක්ෂා කරන බව, අවස්ථාවෝචිතපරිදි, දිවුරීමෙන් හෝ සහතික කර ප්‍රකාශ කිරීමෙන්, මණ්ඩලය විසින් නියම කරනු ලබන පිළිවෙල හා උපචාර අනුව නිල වශයෙන්, 'දිවුරීමක් හෝ සහතික ප්‍රකාශයක්' කළ යුතුය.

දේශාටන නියෝජිතයන් විෂයෙහි නිසි බලධරයා විසින් පාලන බලය ක්‍රියාත්මක කිරීම.

24. දේශාටන නියෝජිත ව්‍යාපාරයක ලියා පදිංචි අයිතිකරු වෙත නිසි බලධරයා විසින් භාරකරනු ලැබූ යම් දන්වීමක සඳහන් නිත්‍යානුකූල විධාන හා නියම, ඒ දන්වීමෙහි සඳහන් කාලය තුළ හෝ ඒ දන්වීමෙහි එසේ කාලයක් සඳහන්කොට නැත්නම් ඒ දන්වීම භාරදුන් දිනයේ සිට දින දහතරක් ඇතුළත හෝ එකී ලියා පදිංචි අයිතිකරු විසින් අනුගමනය කළ යුතුය.

නියමිත නිවේදිත ගාස්තු.

25. ලියාපදිංචි කිරීම සඳහා හෝ බලපත්‍ර සඳහා හෝ ලියාපදිංචි කිරීමේ සටහන්වල හෝ බලපත්‍රවල දෙවැනි පිටපත් හෝ පිටපත් සඳහා ගෙවිය යුතු ගාස්තු ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනයකින් නියම බලධරයා විසින් කලින් කල නියම කළ හැකිය. එකී යම් නිවේදනයක් ඒ බලධරයා විසින් ඒ හා සමාන නිවේදනයක් මගින් සංශෝධන කිරීම හෝ අවලංගු කිරීම හෝ සම්පූර්ණයෙන් වෙනස් කිරීම හෝ කළ හැකිය.

ලේඛන භාරදීම.

26. (i) යම් තැනැත්තකුට භාරදිය යුතුයයි හෝ නිකුත් කළ යුතුයයි මේ ව්‍යවස්ථා සංග්‍රහයෙන් නියම කෙරෙන හෝ බලය දෙනු ලබන යම් ලේඛනයක් ඔහුට පුද්ගලිකව භාර නුදුනහොත් හෝ නිකුත් නොකළ හොත් ඔහු අන්තිම වරට පදිංචිව සිටියේයයි හෝ අන්තිම වරට ව්‍යාපාරය පවත්වාගෙන ගියේයයි කියා දැන ගන්නට ලැබෙන ස්ථානයට එය ලියාපදිංචි කළ තැපෑලෙන් යැව්වහොත් එය යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස හෝ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

(2) මේ නියෝගයේ 'ලේඛනය' යන්නෙන් යම් ආඥාවක, යම් බලපත්‍රයක, යම් විධානයක හෝ කවර හෝ නාමයකින් හෝ අභිධානයකින් වුවද හඳුන්වනු ලබන වෙනත් යම් ලේඛනයක පිටපතක් අදහස් වේ.

අර්ථ නිරූපනය.

27. (i) මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පද සම්බන්ධයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,—

යම් ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමේ සටහනක හෝ බලපත්‍රයක යම් දෙවැනි පිටපතක් හෝ පිටපතක් සම්බන්ධයෙන් 'නියමිත නිවේදිත ගාස්තුව' යන්නෙන් 27 වන නියෝගය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයකින් නිසි බලධරයා විසින් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබූ ගාස්තුව අදහස් වේ ;

''මණ්ඩලය'' යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ 2 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ ;

''මණ්ඩලයේ සභාපති'' යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතෙහි 6 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති අදහස් වේ ;

''මණ්ඩලයේ සාමාජික'' යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතෙහි 6 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ සාමාජිකයෙක් අදහස් වේ ;

''පන්තිය'' හෝ ''වර්ගකිරීම'' යන්න දේශාටක නියෝජිතයකුගේ ව්‍යාපාරයට අදාළව යෙදී ඇති විට, නිසි බලධරයා විසින් ඒ ව්‍යාපාරයට දී ඇති ලියාපදිංචි කළ පන්තිය හෝ වර්ග කිරීම ඉන් අදහස් වේ ;

''නිසි බලධරයා'' යන්නට පනතෙහි දී ඇති අර්ථයම ඇත ;

''බලපත්‍රය'' යන්නෙන් නියම බලධරයා විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රය අදහස් වේ ;

''ලියාපදිංචි කළ'' යන්නෙන් දේශාටන නියෝජිත ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබූ බව අදහස් වේ ;

''පනත'' යන්නෙන් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අදහස් වේ ;

''දේශාටන නියෝජිත'' යන්නට පනතෙහි දී ඇති අර්ථයම ඇත.

ඇල්.ඩී.—ඕ. 26/68

**1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත**

නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ 77 වැනි හා 96 වැනි වගන්ති යටතේ ලංකා සංචාරක මණ්ඩලය විසින් සාදනු ලැබූ නියෝග.

ධර්මසිරි සේනානායක,
සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

1973 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹදීය.

නියෝග

ලුහුඬු නාමය.

1. මේ නියෝග 1973 සංචාරක හෝටල් ව්‍යවස්ථා සංග්‍රහය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වැනි කොටස**

සංචාරක හෝටල් වර්ග කිරීම

සංචාරක හෝටල් වර්ග කිරීම.

2. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍ය්‍යයන් සඳහා, සංචාරක හෝටල්, තාරකා පංතියේ සංචාරක හෝටල් වශයෙන් වර්ග කළ යුතු අතර, ඒවාට—

(අ) එක්තරු සංචාරික හෝටල්, එනම්, ඒ පංතියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන් ගෙන් අනූනව සමන්විත වන නමුත්, වෙනත් යම් උසස් තාරකා පංතියක හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවයන්ගෙන් සමන්විත නොවන, සංචාරික හෝටල්

(ආ) දෙ තරු සංචාරික හෝටල්, එනම්, ඒ පංතියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන් ගෙන් අනූනව සමන්විත වන නමුත්, වෙනත් යම් උසස් තාරකා පංතියක හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන්ගෙන් සමන්විත නොවන සංචාරික හෝටල්,

(ඇ) තුන්තරු සංචාරික හෝටල්, එනම්, ඒ පංතියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන් ගෙන් අනූනව සමන්විත වන නමුත්, වෙනත් යම් උසස් තාරකා පංතියක හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන්ගෙන් සමන්විත නොවන සංචාරික හෝටල්,

(ඈ) සිව්තරු සංචාරික හෝටල්, එනම්, ඒ පංතියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන්ගෙන් ගෙන් අනූනව සමන්විත වන නමුත්, වෙනත් යම් උසස් තාරකා පංතියක හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන්ගෙන් සමන්විත නොවන සංචාරික හෝටල්,

(ඉ) පස්තරු සංචාරික හෝටල්, එනම්, ඒ පංතියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වන සංචාරික හෝටල්

ඇතුළත් වේ.

සංචාරික හෝටල්වල මූලික අවශ්‍යතාවන් නියම කිරීමේ බලය.

3. නිසි බලධරයා විසින් සුදුසුයයි සලකනු ලබන, හෝටල් ව්‍යාපාරයේ යෙදී සිටින මණ්ඩල හා පුද්ගලයින් විමසීමෙන්, තරු පංතියේ සංචාරික හෝටල් විසින් පිළිපැදිය යුතු (මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 'නියමිත මූලික අවශ්‍යතාවන්' යනුවෙන් හැඳින්වෙන) මූලික අවශ්‍යතාවන්, කලින් කල, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් නියම කළ හැකිය. විවිධ තාරකා පංතිවල සංචාරික හෝටල් සම්බන්ධයෙන් විවිධ නියමිත මූලික අවශ්‍යතාවන් එසේ නියම කළ හැකිය.

ඇතැම් සංකේත පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සංචාරික හෝටල්වලට ඇති අයිතිය.

4. (1) ලියාපදිංචි කළ සංචාරික හෝටලයකට—

(අ) එය එක්තරු සංචාරික හෝටලයක් වශයෙන් ලියාපදිංචි කර තිබේ නම්, එක්තරු සංචාරික හෝටල් නියෝජනය කිරීම සඳහා නිසි බලධරයා විසින් අනුමත කරනු ලැබූ සංකේතය ස්වකීය නාමයත් සමඟ පාවිච්චි කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ;

(ආ) එය දෙතරු සංචාරික හෝටලයක් වශයෙන් ලියාපදිංචි කර තිබේ නම්, දෙතරු සංචාරික හෝටල් නියෝජනය කිරීම කිරීම සඳහා නිසි බලධරයා විසින් අනුමත කරනු ලැබූ සංකේතය ස්වකීය නාමයත් සමඟ පාවිච්චි කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීම ;

(ඇ) එය තුන්තරු සංචාරික හෝටලයක් වශයෙන් ලියාපදිංචි කර තිබේ නම්, තුන්තරු සංචාරික හෝටල් නියෝජනය කිරීම සඳහා නිසි බලධරයා විසින් අනුමත කරනු ලැබූ සංකේතය ස්වකීය නාමයත් සමඟ පාවිච්චිකිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ;

(ඈ) එය සිව්තරු සංචාරික හෝටලයක් වශයෙන් ලියාපදිංචි කර තිබේ නම්, සිව්තරු සංචාරික හෝටල් නියෝජනය කිරීම සඳහා නිසි බලධරයා විසින් අනුමත කරනු ලැබූ සංකේතය ස්වකීය නාමයත් සමඟ පාවිච්චි කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ; සහ

(ඉ) එය පස්තරු සංචාරික හෝටලයක් වශයෙන් ලියාපදිංචි කර තිබේ නම්, පස්තරු සංචාරික හෝටල් නියෝජනය කිරීම සඳහා නිසි බලධරයා විසින් අනුමත කරනු ලැබූ සංකේතය ස්වකීය නාමයත් සමඟ පාවිච්චි කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ;

හිමිකම තිබේ.

(2) ලියාපදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක් විසින් (1) වන ඡෙදයේ සඳහන් යම් සංකේතයක් පාවිච්චි කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම, ඒ ඡෙදය යටතේ ඊට හිමිකම ලැබී තිබුණහොත් මිස, නොකළ යුතුය.

(3) ලියාපදිංචි කරනු ලැබූ කිසිම සංචාරික හෝටලයක් විසින්, වංචනික සංකේතයක් හෝ (1) වැනි ඡෙදයෙහි සඳහන් යම් සංකේතයක බැලූ බැල්මට පෙනෙන අනුකරණයක් හෝ පාවිච්චි කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ පාවිච්චි කරවීම හෝ ප්‍රදර්ශනය කරවීම නොකළ යුතුය.

(4) ලියාපදිංචි කරනු ලැබූ කිසිම සංචාරික හෝටලයක් විසින්, නිසි බලධරයා විසින් ඊට පවරනු ලැබූ තාරකා පංති අනුව වර්ග කිරීම ප්‍රදර්ශනය නොකොට, ' ලියාපදිංචි කරනු ලැබූ සංචාරික හෝටලය ' යන වචන හෝ ' සංචාරික හෝටලය ' යන වචන ඇතුළත් යම් නාමයක් හෝ අභිධානයක් හෝ පාවිච්චි කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

(5) එබඳු යම් සංකේතයක්, යම් අත් පත්‍රිකාවක, දැන්වීම් පත්‍රිකාවක, ප්‍රචාරක කොළයක, දැන්වීමක, විජ්ඤයක, ලාංඡනයක හෝ කුමන නාමයකින් හෝ අභිධානයකින් හෝ හැඳින්වෙන වෙනත් යම් සාධන පත්‍රයක, දෙයක හෝ ලේඛනයක හෝ එබන්දක් මතුපිට, ඒ හෝටලයේ නමත් සමඟ සඳහන් වන්නේ නම්, මේ නියෝගයේ කාර්‍ය්‍යයන් සඳහා යම් ලියාපදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක් විසින් ස්වකීය නාමයත් සමග (1) වැනි ඡෙදයෙහි සඳහන් යම් සංකේතයක් පාවිච්චි කරනු ලබන ලෙස සැලකිය යුතුය.

(6) මේ නියෝගයේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමේ හේතුවෙන්, ලියාපදිංචි කළ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ යම් වරදක් සිදුකර ඇති අවස්ථාවක, ඒ හෝටලයේ ලියාපදිංචි කළ අයිතිකරු ඒ වරද සඳහා වරදකරු වන්නේය.

## II වැනි කොටස

### සංචාරික හෝටල් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම විධිමත් කිරීම

ලියාපදිංචි කළ සංචාරික හෝටල් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම විධිමත් කිරීම.

5. (1) නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබූ (මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 'පාවිච්චි කරන්නාගේ බලපත්‍රය' යනුවෙන් හැඳින්වෙන) බලපත්‍රයක බලය යටතේ හා එහි නියම හා කොන්දේසි අනුව හා ඒවා යටතේ මිස, ලියා පදිංචි කරනු ලැබූ කිසිම සංචාරික හෝටලයක් හෝ එහි යම් කොටසක්, සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා නොවන කිසිම කාර්‍යයක් සඳහා පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය.

(2) ලියා පදිංචි කළ යම් තරු පන්තියක සංචාරික හෝටලයක් හෝ එහි යම් කොටසක් හෝ සම්බන්ධයෙන් පාවිච්චි කරන්නාගේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක දී, ඒ පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම හෝ හේතුකොට ගෙන, ඒ තාරකා පන්තියේ සංචාරික හෝටල් සම්බන්ධයෙන් නියමිත මූලික අවශ්‍යතාවන් අනුව ක්‍රියා කිරීම ඒ හෝටලය විසින් පැහැර නොහරිනු ලබන බවට නිසි බලධරයා සෑහීමට පත්වුවහොත් මිස, ඒ ඉල්ලීමට ඒ බලධාරයා විසින් ඉඩ නොදිය යුතුය.

(3) ලියා පදිංචි කළ යම් සංචාරික හෝටලයක් හෝ එහි යම් කොටසක් හෝ පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සම්බන්ධයෙන් වූ මේ නියෝගයෙහි යම් විධි විධානයක් උල්ලංඝනය කිරීමෙන් පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරු හා ඒ හෝටලය හෝ එහි ඒ කොටස හෝ එසේ පාවිච්චි කළ හෝ පරිහරණය කළ තැනැත්තා ද යන එක් එක්කෙනා ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය.

බලපත්‍ර සඳහා කෙරෙන ඉල්ලීම්.

6. (1) පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලීමක්—

(අ) ඒ කාර්‍යය සඳහා නිසි බලධරයා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි ලියා නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය ;

(ආ) ඒ ආකෘති පත්‍රයෙහි නියමිත විස්තර ඇතුළත් වූවක් විය යුතුය ;

(ඇ) ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතුය.

(2) පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ලැබුණු අවස්ථාවක, 9 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව නිසි බලධරයා විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් හෝ නියමයක් කළ හැකිය ;

එසේ වුවද, පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් නිසි බලධරයා විසින් ප්‍රතික්ෂේප කරන යම් අවස්ථාවක, එසේ ප්‍රතික්ෂේප කිරීමේ හේතු ඔහුගේ නියමයෙහි සඳහන් කළ යුතුය.

(3) පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමකට ඉඩ දෙමින් නිසි බලධරයා විසින් නියමයක් කරන අවස්ථාවක තමා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකින් ඒ බලපත්‍රය ඔහු විසින් ඒ ඉල්ලුම් කරු වෙත නිකුත් කළ යුතුය.

(4) පනතෙහි හා මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට සැලැස්වීම සඳහා අවශ්‍යයයි තමා විසින් සලකනු ලබන හා බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව සහ 49 වන වගන්තියෙහි විධි විධාන වලටද යටත්ව පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් නිසි බලධරයා විසින් නිකුත් කළ හැකිය.

(5) බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කිරීමක් හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හැරීමක් හෝ සිදුවූ අවස්ථාවක 9 වැනි නියෝගයේ විධිවිධාන වලට යටත්ව නිසි බලධරයා විසින් නියමයකින් ඒ බලපත්‍රය අවලංගු කළ හැකි බව සෑම පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක කොන්දේසියක් විය යුතුය.

එසේ වුවද, නිසි බලධරයා විසින් බලපත්‍රයක් අවලංගු කරන යම් අවස්ථාවක, එසේ අවලංගු කිරීමේ හේතු ඔහුගේ නියමයෙහි සඳහන් කළ යුතුය.

නිසි බලධරයා විසින් මේ කොටස යටතේ කරනු ලබන නියමවල පිටපත් පුද්ගලයන් වෙත භාරදිය යුතු බව.

7. (1) පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් සඳහා කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් තමන් විසින් කරනු ලැබූ සෑම නියමයක සහතික පිටපතක් ඉල්ලුම්කරු වෙත ද පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් අවලංගු කරමින් තමන් විසින් කරනු ලැබූ සෑම නියමයක පිටපතක් ඒ බලපත්‍ර දරන්නා වෙතද භාරදෙනු ලැබීමට නිසි බලධරයා විසින් කටයුතු සැලැස්විය යුතුය.

(2) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් ඉල්ලූ කරන්නකු හෝ බලපත්‍රයක් දරන්නකු හෝ වෙත භාර දෙනු ලැබූ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ නියමයක සෑම සහතික පිට පතකම එසේ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ නියමය කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතුය

නිසි බලධරයාගේ නියමය අවසානාත්මක හා තීරණාත්මක වන බව.

8. මේ කොටස යටතේ නිසි බලධරයා විසින් කරනු ලැබූ යම් නියමයක් අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

බලපත්‍ර සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම හෝ බලපත්‍ර අවලංගු කිරීම හෝ පිළිබඳ විශේෂ විධිවිධාන.

9. පාවිච්චි කරන්නකුගේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් හෝ එබඳු බල පත්‍රයක් අවලංගු කරමින් හෝ නියමයක් කිරීමට පෙර, පුද්ගලිකවම හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිත යකුගේ මාර්ගයෙන් හෝ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක්, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලුම්කරුට හෝ ඒ බලපත්‍රය දරන තැනැත්තාට හෝ නිසි බලධරයා විසින් දිය යුතුය.

## III වන කොටස

### ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටල් කවරේද යන්න සහ එවැනි හෝටල් ලියා පදිංචි කිරීම

ලියා පදිංචි කිරීමට යටත් වන සංචාරක හෝටල්

10. (1) සංචාරික හෝටලයක් සම්බන්ධයෙන්, නිසි බලධරයා විසින්, වර්ග කිරීමේ කාරක සභාව වෙත යම් යොමු කිරීමක් කරනු ලැබූ විට ඒ හෝටලය ලියා පදිංචි කිරීමට යටත්විය යුතුයයි එම කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබුවහොත් පමණක් ඒ හෝටලය මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ හා එහි විධිවිධානවලට අනුකූලව ලියා පදිංචි කරනු ලැබීමට යටත් විය යුතුය.

(2) 3 වන නියෝගයෙහි සඳහන් වූ නියමිත මූලික අවශ්‍යතා අනුව තාරකා පන්තියේ සංචාරික හෝටලයක් ලෙස වර්ග කරනු ලැබීමට ඒ හෝටලය සුදුසු නම් මිස වර්ග කිරීමේ කාරක සභාව විසින් එවැනි කිසිම නිශ්චය කිරීමක් නොකළ යුතු අතර, ඒ හෝටලයට වෙන් කරන ලද තාරකා පන්තිය එවැනි සෑම නිශ්චය කිරීමකම සඳහන් විය යුතුය.

(3) මේ නියෝගයෙහි ඉහත දැක්වුණු විධිවිධාන අනුව ලියා පදිංචි කරනු ලැබීමට යටත් සංචාරික හෝටලයක් මින්මතු මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 'ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක්' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

සංචාරික හෝටල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සම්බන්ධයෙන් අදාල වන විශේෂ විධිවිධාන.

11. සංචාරික හෝටල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතුය :—

(අ) ඒ හෝටලය ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක් විය යුතුද නැද්ද යන්න නිශ්චය කිරීම සඳහා වර්ග කිරීමේ කාරක සභාව වෙත යොමු කිරීම නිසි බලධරයා විසින් තමාගේම ඕනෑ කමින් හෝ ඒ ව්‍යාපාරයෙහි අයිතිකරුගේ ඉල්ලීම පිට හෝ කළ හැකිය.

(ආ) ඒ යොමු කිරීමේ විෂය කරුණ සම්බන්ධයෙන් නිසි බලධරයාගේ අදහස් ඇතුළත් ලිඛිත වාර්තාවක් ඒ යොමු කිරීම සමඟ නිසි බලධරයා විසින් යැවිය යුතුය.

(ඇ) (i) මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පසුව දක්වෙන විධිවිධාන වලින් පැවරුණු ඇතුළුවීමේ, පරීක්ෂා කිරීමේ හා විභාග කිරීමේ බලතල ඒ ස්ථානය සම්බන්ධයෙන් තමා විසින් හෝ ඒ සඳහා තමා බලය පැවරූ යම් නිලධරයකු විසින් ක්‍රියාවේ යොදවා ඇතොත් මිස ; සහ

(ii) ඒ ව්‍යාපාරයෙහි අයිතිකරු විසින්ම පුද්ගලිකව කරුණු කියා සිටීමට හෝ ඔහු විසින් ලියවිල්ලෙන් බලය පවරණු ලැබූ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමට නිසි බලධරයා විසින් අවස්ථාවක් දෙන ලද්දේ නම් මිස,—

නිසි බලධරයා විසින් තමාගේම ඕනෑකමින් එවැනි කිසිම යොමු කිරීමක් නොකළ යුතුය.

සංචාරික හෝටල් ලේඛනය.

12. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා 'සංචාරික හෝටල් ලේඛනය' නමින් හැඳින්වෙන පොතක් තමා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට පවත්වාගෙන යාම හෝ පවත්වාගෙන යෑමට සැලැස්වීම හෝ නිසි බලධරයා විසින් කළ යුතුය. ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාරය පවත්වාගෙන යෑමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන හා ඒ ව්‍යාපාරයේ අයිතිකරු මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ හා අනුව ඒ ලේඛනයෙහි ලියා පදිංචි කළ යුතුය. ඒ ලේඛනය මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 'ලේඛනය' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ලියාපදිංචි කිරීමට යටත් සංචාරික හෝටල් ලියාපදිංචි කිරීමට නියමවූවිට

13. (1) 10 වන නියෝගය යටතේ කරන ලද නිශ්චයක් පිළිබඳ දැන්වීම භාර දෙන ලද දින සිට මාස 3ක කාලයක් ගත වූ විට හා ඉන් පසු, ඒ නිශ්චය කිරීම අදළ වන කිසිදු සංචාරික හෝටලයකට අයත් ගොඩනැගිලි සහ භූමි භාගය ඒ හෝටලයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා පාවිච්චි කිරීම, මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ඒ ස්ථානය හා ඒ ව්‍යාපාරයේ අයිතිකරු ලියා පදිංචි කර ඇතහොත් මිස, නොකළ යුතුය.

(2) මේ නියෝගයේ 1 වන ඡේදයෙහි විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ ව්‍යාපාර කටයුතුවල අයිතිකරු හා එවකට එය භාරව සිටින තැනැත්තාද යන එක් එක් කෙනා ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය.

ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම.

14. (1) සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ලියා පදිංචි කිරීමට යටත් යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන සෑම ඉලීමක්ම—

(අ) ලියවිල්ලකින් නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය;

(ආ) ඒ බලධරයා විසින් ඒ කාර්‍ය්‍යය සඳහා සපයනු ලබන ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතුය;

(ඇ) සැපයීමට ඒ ආකෘතියෙහි නියමිත විස්තර එහි අඩංගු විය යුතුය; තවද

(ඈ) ඒ සංචාරික හෝටලයේ ව්‍යාපාර කටයුතුවල අයිතිකරු විය යුතු ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතුය.

(2) ලියා පදිංචි කිරීම සඳහා නියමිත නිවේදිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් මිස කිසිම ස්ථානයක් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍ය්‍යය සඳහා ලියා පදිංචි නොකළ යුතුය.

ලියාපදිංචිකිරීමේදී සංචාරික හෝටල් වර්ග කිරීම.

15. (1) යම් කිසි ස්ථානයක්—

(අ) 2 (අ) වැනි නියෝගයෙහි සඳහන් නියමිත අවම අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වුවහොත් මිස, ඒ ස්ථානය එක් තරු සංචාරික හෝටලයක් වශයෙන්;

(ආ) 2 (ආ) වැනි නියෝගයෙහි සඳහන් නියමිත අවම අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වුවහොත් මිස,— ඒ ස්ථානය දෙ තරු සංචාරික හෝටලයක් වශයෙන්;

(ඇ) 2(ඇ) වැනි නියෝගයෙහි සඳහන් නියමිත අවම අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වුවහොත් මිස, ඒ ස්ථානය තුන් තරු සංචාරික හෝටලයක් වශයෙන්;

(ඈ) 2(ඈ) වැනි නියෝගයෙහි සඳහන් නියමිත අවම අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වුවහොත් මිස, ඒ ස්ථානය සිව්තරු සංචාරික හෝටලයක් වශයෙන්; සහ

(ඉ) 2(ඉ) වැනි නියෝගයෙහි සඳහන් නියමිත අවම අවශ්‍යතාවන්ගෙන් නොඅඩුව සමන්විත වුවහොත් මිස, ඒ ස්ථානය පස්තරු සංචාරික හෝටලයක් වශයෙන්

ලියා පදිංචි කිරීම හෝ ලියා පදිංචි කිරීම පවත්වාගෙන යාම හෝ නොකළ යුතුය.

(2) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලියා පදිංචි කළ යුතු යම් සංචාරික හෝටලයක්, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිශ්චයක් කිරීම සඳහා වර්ග කිරීමේ කාරක සභාව වෙත කරනු ලැබූ යොමු කිරීමක් අනුව හෝටලයක පංතිය සම්බන්ධයෙන් එය විසින් කරනු ලැබූ නිශ්චය කිරීම අනුව, එක්තරු සංචාරික හෝටලයක් හෝ දෙ තරු සංචාරික හෝටලයක් හෝ තුන් තරු සංචාරික හෝටලයක් හෝ සිව් තරු සංචාරික හෝටලයක් හෝ පස් තරු සංචාරික හෝටලයක් හෝ වශයෙන් ලියා පදිංචි කළ යුතුය.

ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

16. (1) යම් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලබන ලියා පදිංචි කිරීමට යටත් යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලැබුණු විට, 19 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව, නිසි බලධරයා විසින්,—

(අ) ඒ ඉල්ලීමට ඉඩදෙමින් නියමයක් කළ හැකිය; නැතහොත්

(ආ) ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් නියමයක් කළ හැකිය;

එසේ වුවද, ඉල්ලීමක් ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක එසේ කිරීම සම්බන්ධයෙන් ඔහුගේ හේතු ඔහුගේ නියමයෙහි සඳහන් කළ යුතුය.

(2) ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා යම් ස්ථානයක් ලියා පදිංචි කිරීමට ඉල්ලා ඇති විටකදී, ඒ ඉල්ලුම්කරු හෝ ඒ සංචාරික හෝටලයේ ව්‍යාපාර කටයුතු සඳහා සේවයේ යොදවනු ලැබූ හෝ සේවයේ යෙදවීමට යෝජිත යම් තැනැත්තකු, එසේ ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලීමේ දිනයට පෙරාතුවම වූ අවුරුදු පහක කාල සීමාව ඇතුළත මුදල් නීති පනත, විනිමය පාලන පනත, 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත, ඖෂධ ආඥාපනත හෝ ආනයන හා අපනයන පාලන පනත යටතේ වරදක් සම්බන්ධයෙන් හෝ ඒ සංචාරක හෝටලයේ ගොඩනැගිලි හෝ භූමි භාගය නීති විරෝධී කාර්යයක් සඳහා පාවිච්චි කිරීමේ වරදක් සම්බන්ධයෙන් හෝ චරිත දූෂණය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබ තිබුණහොත් හෝ, ඒ ඉල්ලුම්කරු හෝ සේවකයා හෝ යෝජිත සේවකයා හෝ ඉහතකී කාලය තුළ වෙනයම් රටක අනුරූප නීති යටතේ සමාන වරදක් හෝ වැරදි හෝ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබුණ හොත්, ඒ සංචාරික හෝටලයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානය ලියා පදිංචි කිරීම නිසි බලධරයා විසින් නියමයකින් ප්‍රතික්ෂේප කළ හැකිය.

එසේ වුවද ඉල්ලුම්කරුගේ සේවකයා විසින් ඒ වරද කරනු ලැබුවේ තමාගේ අනු දැනුමක් නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව හෝ නිසි බලධරයා සෑහීමට පත්වන අයුරු ඉල්ලුම්කරු ඔප්පු කරන්නේ නම්, ඉල්ලුම්කරු සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තකු මේ ඡේදයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමේ හේතුව පිට, ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ නියමයක් නොකළ යුතුය.

3. (අ) ලියා පදිංචි කිරීම යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමේ කාර්‍ය්‍ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් නියි බලධරයා විසින් නියමයක් කරනු ලබන අවස්ථාවක ඒ නියමයේ සහතික පිටපතක් ඉල්ලුම්කරුවෙත භාරදීමට ඔහු විසින් කටයුතු සැලැස්විය යුතුය.

(ආ) ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබූ ඉල්ලුම්කරුවකු වෙත භාරදෙනු ලබන ප්‍රතික්ෂේප කිරීමේ එබඳු නියමයක සෑම සහතික පිටපතකම ඒ ප්‍රතික්ෂේප කිරීමේ නියටය කිරීමට තුඩුදුන් හේතුන් ඇතුළත් විය යුතුය.

4. (අ) ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍ය්‍ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමකට ඉඩ දෙමින් නියි බලධරයා නියමයක් කරන අවස්ථාවක, ඔහු විසින් ඒ ස්ථානය ලේඛනයෙහි ලියා පදිංචි කළ යුතුය. තවද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිශ්චය කිරීම සඳහා වර්ග කිරීමේ කාරක සභාව වෙත කරනු ලැබූ යම් යොමු කිරීමක් පිට ඒ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබූ එහි තාරකා පංතිය පිළිබඳ විස්තර හා ලියා පදිංචි කිරීම ක්‍රියාවේ යොදවනු ලැබීම යටතේ කරනු ලැබූ යම් නියම හෝ කොන්දේසි වූයේ නම් ඒවාද ඇතුළත්ව නියි බලධරයා විසින් නිශ්චය කරනු ලබන විස්තර ඒ ලේඛනයෙහි ඇතුළු කිරීමෙන්, ඉල්ලුම්කරු එහි අයිතිකරු වශයෙන් ඒ ලේඛනයෙහි ලියා පදිංචි කළ යුතුය.

(ආ) මේ නියෝගය යටතේ ලේඛනයෙහි ඇතුළු කරනු ලබන සෑම සටහනක්ම මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 'ලියා පදිංචි කිරීමේ සටහන' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ඇ) සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතුවල අයිතිකරු වශයෙන් මේ නියෝගය යටතේ ලියා පදිංචි කරනු ලැබූ තැනැත්තකු මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 'ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ඈ) මේ ඡෙදයෙහි දක්වුණු විධිවිධාන යටතේ නියි බලධරයා විසින් සංචාරික හෝටලයකට අදාළ ලියාපදිංචි කිරීමේ සටහනෙහි ඒ සංචාරික හෝටලය ලියා පදිංචි කරනු ලැබූ තාරකා පංතිය අවසානාත්මක විය යුතුය.

5. ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමේ කාර්‍ය්‍ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක ලියා පදිංචි කිරීම, 45(2) නියෝගයෙහි විධිවිධානවලටද ඒ ලියා පදිංචි කිරීම සංයුක්ත වන ලියා පදිංචි කිරීමේ සටහනෙහි නිශ්චිතව සඳහන් නියමවලට හා කොන්දේසිවලට ද යටත්ව කළ හැකි අතර, එසේ නිශ්චිතව සඳහන් කරන ඒ නියම කොන්දේසි—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා; සහ

(ආ) ඒ හෝටලය වෙත පවරන ලද තාරකා පන්තියට නියමිත මූලික අවශ්‍යතා අනුව ඒ හෝටලය ක්‍රියා කරන බවට සහතික වීම සඳහා

නියි බලධරයා විසින් අවශ්‍යයයි සලකනු ලබන නියම හා කොන්දේසි විය යුතුය.

(6) ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍ය්‍ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් තමන් විසින් කරනු ලැබූ නියමයක ප්‍රතිඵල වශයෙන් ඒ ස්ථානය නියි බලධරයා විසින් ලියා පදිංචි කර ඇති කල්හි, ඒ හෝටලයට අදාළ ලියා පදිංචි කිරීමේ සටහනෙහි පිටපතක් තමාගේ අත්සන තබා සහතිකකොට ඒ හෝටලයේ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරුවෙත භාරදෙනු ලැබීමට නියි බලධරයා විසින් සැලැස්විය යුතුය.

ලියා පදිංචි කරන ලද සංචාරික හෝටල් පිළිබඳ තාරකා පන්ති වර්ග කිරීම ප්‍රතිශෝධනය කිරීම.

17. (1) යම් තාරකා පංතියක සංචාරික හෝටලයක් ලියා පදිංචි කිරීමෙන් පසු යම් අවස්ථාවක, තමාගේම ඕනෑකමින්ම හෝ ඒ වෙනුවෙන් ඔහු වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව, නියි පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව, එහි තාරකා පංතිය නැති කිරීමේ හෝ ඒ තාරකා පංතිය ප්‍රතිශෝධනය කොට අළුත් තාරකා පන්තියක් එයට පැවරීමේ ප්‍රශ්නය නිශ්චය කළ යුතු බවට නියි බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ ප්‍රශ්නය නිශ්චය කිරීම සඳහා එය වර්ග කිරීමේ කාරක සභාව වෙත ඒ බලධරයා විසින් යොමු කළ හැකිය.

ඒ යොමු කිරීම පිට කරනු ලැබූ නිශ්චය කිරීමෙන්—

(අ) එහි තාරකා පන්තිය නැති කිරීමට නියම කරනු ලැබුවහොත් නියි බලධරයා විසින් ඒ නිශ්චය කිරීම අනුව ඒ හෝටලයට අදාළ සටහන ලේඛනයෙන් ඉවත් කළ යුතුය; නැතහොත්

(ආ) එහි තාරකා පන්තිය ප්‍රතිශෝධනය කොට එම හෝටලයට අලුත් තාරකා පන්තියක් පැවරීමට නියම වේ නම් නියි බලධරයා විසින් ඒ නිශ්චය කිරීම ක්‍රියාවෙහි යෙදවීමට අවශ්‍ය සංශෝධන ලියා පදිංචි කිරීමේ සටහනෙහි කළ යුතුය.

එසේ කරනු ලබන යම් ඉවත් කිරීමක් හෝ සංශෝධනයක් අවසානාත්මක වන්නේය.

(2) ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ නියෝගය යටතේ නියිබලධරයා විසින් කරනු ලැබූ යම් යොමු කිරීමක පිටපතක් ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරු වෙත භාර කරවීමට සැලැස්විය යුතුය.

සංචාරික හෝටලයක ලියා පදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

18. (1) (අ) යම් සංචාරික හෝටලයක ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් කෙනෙකු සංචාරික හෝටලයට අදාළ මේ ව්‍යවස්ථා සංග්‍රහයේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමෙන් මේ පනත යටතේ කළ යම් වරදක් සම්බන්ධයෙන් හෝ, මුදල් නීති පනත හෝ 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත හෝ විනිමය පාලන පනත හෝ රේගු ආඥාපනත හෝ ආනයන හා අපනයන පාලන පනත හෝ යටතේ කළ යම් වරදක් සම්බන්ධයෙන් හෝ, ඒ හෝටලය යම් නීති විරෝධී කාර්යයක් සඳහා පාවිච්චි කිරීමේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ චරිත දූෂණය පිළිබඳ යම් වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබූ විට හෝ, ඒ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් කෙනෙකු වෙන යම් රටක අනුරූප නීති යටතේ සමාන වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, හෝ

(ආ) 16(4) වැනි නියෝගය ප්‍රකාර යම් සංචාරික හෝටලයක් ලියා පදිංචි කිරීමේ සටහනේ නිශ්චිතව සඳහන් යම් නියම හෝ කොන්දේසි කඩකිරීම සඳහා

නියි බලධරයා විසින්, 19 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව, නියමයක මාර්ගයෙන් ඒ සංචාරික හෝටලයේ ලියා පදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකිය.

යම් සංචාරික හෝටලයක ලියා පදිංචි කිරීම අත්හිටුවමින් හෝ අවලංගු කරමින් නියි බලධරයා විසින් කරනු ලැබූ සෑම නියමයකම ඒ නියමය සඳහා ඔහුගේ හේතු ඇතුළත් විය යුතුය.

(2) සේවකයා විසින් වරද සිදුකර ඇත්තේ තමාගේ අනුදැනීමක් නැතිව බව හෝ වරද කිරීම වැළැක්වීමට නියි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව සංචාරික හෝටලයක ලියා පදිංචි කළ අයිතිකරු විසින් නියි බලධරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරත හොත් (1) වන ඡෙදයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඒ හෝටලයේ යම් සේවකයකු වරදකරු කරනු ලැබීමේ හේතුව පිට එම ඡෙදය යටතේ ඒ හෝටලයේ ලියා පදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම නොකළ යුතුය.

(3) සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ලියා පදිංචි කරනු ලැබූ යම් ස්ථානයක් ඒ කාර්යය සඳහා පාවිච්චි කිරීම නතරවී තිබෙන බවට, තමාගේ ඕනෑකම පිට හෝ ඒ වෙනුවෙන් තමා වෙත කරුණු දැක්වීමෙන් පසු, නියි පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව, නියි බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ බලධරයා විසින් 19 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව නියමයක මාර්ගයෙන් ඒ ලියා පදිංචි කිරීම අවලංගු කළ හැකිය.

(4) සංචාරික හෝටලයක ලියා පදිංචි කිරීම අත්හිටුවමින් හෝ අවලංගු කරමින් හෝ නියි බලධරයා විසින් මේ කොටස යටතේ කරනු ලබන නියමයක සහතික පිටපතක්, ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරු වෙත භාරකරවීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ නියමයක සෑම සහතික පිටපතකම, ඒ නියමය කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතුය.

ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ නියමයවලට අදල විශේෂ විධිවිධාන.

19. ලියා පදිංචි කිරීමට යටත් සංචාරක හෝටලවල ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාරියය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ එබඳු ලියා පදිංචි කිරීමක් අත්හිටුවීමෙ හෝ අවලංගු කිරීමේ හෝ නියමයක් කිරීමට පෙර, නිසි බලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරුට, තමා විසින්ම හෝ ලියවිල්ලකින් තමා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතුය.

මේ කොටස යටතේ නිසි බලධරයා විසින් කරනු ලැබූ නියම අවසානාත්මක හා තීරනාත්මක බව.

20. ලියා පදිංචි කිරීමට යටත් සංචාරික හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍යය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් හෝ එබඳු ලියා පදිංචි කිරීමක් අත්හිටුවමින් හෝ අවලංගු කරමින් හෝ මේ කොටස යටතේ නිසි බලධරයා විසින් කරනු ලබන යම් නියමයක්, අවසාන හා තීරණාත්මක වන්නේය.

ලියා පදිංචි කිරීමේ සටහනක විස්තර නිවැරදි කිරීම.

21. ලියා පදිංචි කළ සංචාරික හෝටලයකට අදළ ලියාපදිංචි කිරීමේ සටහනෙහි විස්තර පිළිබඳ යම් සංශෝධනයක් කළ යුතු වන පරිදි ඒ හෝටලයකට අදළ යම් කරුණක හෝ දෙයක යම් වෙනසක් ඇති වූ අවස්ථාවක, ඒ හෝටලයේ ලියාපදිංචි කළ අයිතිකරු විසින් ඒ වෙනස්වීම නොපමාව නිසි බලධරයාට දැනුම් දිය යුතු අතර, ඒ දැන්වීම ලැබුණු විට ඒ බලධරයා විසින් සුදුසුයයි සලකනු ලබන පරීක්ෂණයකින් පසුව 17 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව ඒ විස්තර අවශ්‍ය පරිදි සංශෝධනය කළ හැකිය.

## IV වැනි කොටස

### ලියා පදිංචි කළ සංචාරක හෝටල් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

ලියා පදිංචි කළ සංචාරික හෝටල් සඳහා බල පත්‍ර ලබාගත යුතු බව.

22. (1) මේ කොටස යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබ එවකට බලපවත්වන බලපත්‍රයක බලය යටතේ ද එහි නියම හා කොන්දේසි යටතේ ද ඒවාට අනුකූලවද මිස, ලියා පදිංචි කළ කිසිදු සංචාරික හෝටලයක් විසින්, එය ලියා පදිංචි කරනු ලැබූ දිනයේ සිට එක් මසක කාලයක් ගතවූ විට හා ඉන් පසුව, සංචාරික හෝටලයක් වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම නොකළ යුතුය.

(2) ලියා පදිංචි කරනු ලැබූ හෝටලයක ගොඩනැගිලි හා භූමි භාගය හෝ එහි යම් කොටසක් හෝ සංචාරක හෝටලයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ කාර්‍යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම්, ඒ සංච රික හෝටලය සංචාරික හෝටලයක් වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ලෙස මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍යයන් සඳහා සැලකිය යුතුය.

(3) ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් විසින් මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය.

බල පත්‍ර පිළිබඳ විස්තර.

23. ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් පහත සඳහන් වර්ගවලින් එකකට අයත් විය යුතුය.
එනම්,—

(අ) තාරකා එකේ සංචාරික හෝටල් බලපත්‍රය,
(ආ) තාරකා දෙකේ සංචාරික හෝටල් බලපත්‍රය,
(ඇ) තාරකා තුනේ සංචාරික හෝටල් බලපත්‍රය,
(ඈ) තාරකා හතරේ සංචාරික හෝටල් බලපත්‍රය, හෝ
(ඉ) තාරකා පහේ සංචාරික හෝටල් බලපත්‍රය.

තවද, ඒ බලපත්‍රය, ලියා පදිංචි කිරීමේ සටහනෙහි දැක්වෙන තාරකා පංති අනුව කළ වර්ග කිරීමට අනුකූල විය යුතුය.

බල පත්‍ර සඳහා වූ ඉල්ලීම්.

24. ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කෙරෙන සෑම ඉල්ලීමක්ම—

(අ) ලියවිල්ලකින් නිසි බලධරයාට ඉදිරිපත් කළ යුතුය;

(ආ) තත් කාර්යය සඳහා නිසි බලධරයා විසින් සපයනු ලබන ආකෘතියකට අනුව කළ යුතුය;

(ඇ) ඒ හෝටලයට අදළ ලියා පදිංචි කිරීමේ සටහනෙහි සඳහන්වන විස්තර විය යුතුවූ ඒ ආකෘතියෙහි නියමිත විස්තර එහි ඇතුළත් විය යුතුය; තවද

(ඈ) ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරු විසින් අත්සන් කළ යුතුය.

බලපත්‍ර සඳහා වූ ඉල්ලීම් ප්‍රතික්ෂෙප කිරීමේ බලයට අදළ විශේෂ විධිවිධාන.

25. (අ) ඉල්ලීම් අදළ වන ස්ථානය සංචාරක හෝටලයක් වශයෙන් ලියා පදිංචි කර නැතහොත්; හෝ

(ආ) 17 වැනි නියෝගය යටතේ වර්ග කිරීමේ කාරක සභාව වෙත කරන ලද යම් යොමු කිරීමක් තීරණයට භාජනය වෙමින් පවතින්නේ නම්; හෝ

(ඇ) ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ වර්ෂයට පෙරාතුවම වර්ෂය සඳහා නිසි බලධරයා විසින්, ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රයක නියම හා කොන්දේසි අනුව ක්‍රියා කිරීම ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු විසින් පැහැර හැර තිබේ නම්, හෝ

(ඈ) ඒ හෝටලයේ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු හෝ ඔහුගේ යම් සේවකයකු, ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබූ වර්ෂයට පෙරාතුවම වර්ෂය තුළ, මේ ව්‍යවස්ථා සංග්‍රහය ඒ හෝටලයට අදළව ක්‍රියාත්මක කිරීමේදී එහි යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමෙන් මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මුදල් නීති පනත, 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත, විනිමය පාලන පනත, රේගු ආඥාපනත හෝ ආනයන හා අපනයන පාලන පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ ඒ හෝටලය යම් නීති විරෝධි කාර්යයන් සඳහා පාවිච්චි කිරීමේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ චරිත දූෂණය පිළිබඳ යම් වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබුවේ නම් නැතහොත් ඒ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් කෙනෙකු වෙනා යම් රටක අනුරූප නීති යටතේ සමාන වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබුවේ නම්; හෝ

(ඉ) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 5 වැනි නියෝගය කඩකරනු ලැබුවහොත් නිසි බලධරයා විසින් බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කළ යුතුය.

උචිත නිවේදිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් මිස බල පත්‍රය නිකුත් නොකළ යුතු බව

26. බලපත්‍රය සඳහා උචිත නිවේදිත ගාස්තුව ගෙවනු ලැබුවහොත් මිස යම් ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

බලපත්‍ර සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

27. (1) ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ලැබුණු විට නිසි බලධරයා විසින් 25 වැනි හා 32 වැනි නියෝගවල විධිවිධානවලට යටත්ව ඒ ඉල්ලීමට ඉඩදෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් හෝ නියමයක් කළ හැකිය;

එසේ වුවද ඔහු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන කවර අවස්ථාවක වුවද එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ඔහුගේ හේතු ඔහුගේ නියමයෙහි සඳහන් කළ යුතුය

(2) ලියා පදිංචි කළ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් නිසි බලධරයා විසින් කරනු ලබන සෑම නියමයකම පිටපතක්, නිසි බලධරයා විසින් ඒ බලපත්‍රය ඉල්ලුම් කළ තැනැත්තා වෙත භාර කරනු ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම්කරු වෙත භාරදෙනුලැබූ ප්‍රතික්ෂෙප කිරීමේ නියමයක සෑම සහතිකපිටපතකම ඒ නියමය කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතුය.

(3) ලියා පදිංචි කළ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමකට ඉඩ දෙමින් නිසි බලධරයා විසින් නියමයක් කරනු ලබන අවස්ථාවක, එහි තාරකා පංතිය පිළිබඳ විස්තර ද යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ඒ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ නම් ඒ නියම හෝ කොන්දේසි ද ඇතුළත්ව ඒ බලධරයා විසින් නිශ්චය කරනු ලබන විස්තර අඩංගු වූ ද ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකෘතියක වූ ද බලපත්‍රයක්, ඔහු විසින් ඉල්ලුම්කරුට නිකුත් කළ යුතුයි.

බලපත්‍රවල නියම හෝ කොන්දේසි

28. (1) ලියා පදිංචි කරනු ලැබූ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් වූ බලපත්‍රයක් ඒ බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් නියම හෝ කොන්දේසිවලට යටත්ව නිකුත් කළ හැකිය. එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන නියම හෝ කොන්දේසි, නිසි බලධරයා විසින් අවශ්‍යයයි සලකනු ලබන පරිදි—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා වූ කොන්දේසි විය හැකිය

(ආ) ඒ හෝටලය වෙත පවරන ලද තාරකා පන්තියට අදළ නිවේදිත අවම අවශ්‍යතාවලට නොඅඩු අවශ්‍යතා ඒ හෝටලය විසින් අනුගමනය කරනු ලබන බවට සහතික කෙරෙන කොන්දේසි විය හැකිය ; තවද

(ඇ) අවශ්‍යයයි නිසි බලධරයා විසින් සලකනු ලබන වෙනත් යම් නියම හෝ කොන්දේසි විය හැකිය.

(2) බලපත්‍රය 45 වන නියෝගයේ විධිවිධානවලට විශේෂයෙන් යටත් වන බව, ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද බල පත්‍රයක නියමයක් හෝ කොන්දේසියක් විය යුතුය.

බලපත්‍ර වලංගු කාලය හා ප්‍රදර්ශනය කිරීම

29. (1) ලියා පදිංචි කරනු ලැබූ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම එහි නිශ්චිතව සඳහන් දිනයෙහි ක්‍රියාත්මක විය යුතු අතර, ඒ බලධරයා විසින් එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබූ දිනයේ සිට දොලොස් මාසයක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතුය.

(2) සෑම සංචාරික හෝටලයක් විසින්, ඒ හෝටලය සම්බන්ධයෙන් නිසි බලධරයා නිකුත් කළ බලපත්‍රය ඒ හෝටලයෙහි ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශණය කළ යුතුය.

බලපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම

30. (1) ලියා පදිංචි කරනු ලැබූ යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක්, පහත සඳහන් අවස්ථාවකදී, එනම්,—

(අ) මේ ව්‍යවස්ථා සංග්‍රහය ඒ හෝටලය කෙරෙහි ක්‍රියාත්මක කිරීමේදී එහි යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමෙන් මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ මුදල් නීති පනත හෝ 1968 අංක 28 දරණ විදේශ විනිමය සහතික පනත හෝ විනිමය පාලන පනත හෝ රේගු ආඥා පනත හෝ ආනයන හා අපනයන පාලන පනත හෝ යටතේ වූ වරදක් සම්බන්ධයෙන් හෝ ඒ හෝටලයේ නීති විරෝධි කාර්යයක් සඳහා පාවිච්චි කිරීමේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ චරිත දූෂණය පිළිබඳ යම් වරදක් සම්බන්ධයෙන් හෝ එහි ලියා පදිංචි කළ අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් කෙනෙකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක හෝ ඒ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු හෝ ඔහුගේ සේවකයන්ගෙන් යම් කෙනෙකු වෙනයම් රටක අනුරූප නීති යටතේ සමාන වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක ; හෝ

(ආ) බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක් ඒ අයිතිකරු විසින් උල්ලංඝනය කළ හෝ එය අනුව ක්‍රියා කිරීම පැහැර හැරි අවස්ථාවක ; හෝ

(ඇ) මේ ව්‍යවස්ථා මාලාවේ 5 වැනි නියෝගයෙහි විධිවිධාන උල්ලංඝනය කළ අවස්ථාවක,

32 වැනි නියෝගයෙහි විධිවිධානවලට යටත්ව ඒ බලධරයා විසින් අත්හිටවනු ලැබිය හැකි බව හෝ අවලංගු කරනු ලැබිය හැකි බව ඒ බලපත්‍රයෙහි නියමයක් හෝ කොන්දේසියක් විය යුතුය.

එසේ වුවද ඔහු බලපත්‍රයක් අත්හිටුවන හෝ අවලංගු කරන කවර වුවද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එසේ අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ සඳහා වූ ඔහුගේ හේතු සඳහන් කළ යුතුය.

(2) සේවකයා විසින් වරද සිදුකර ඇත්තේ තමාගේ අනු දැනීමක් නැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට නිසි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව සංචාරික හෝටලයක ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු නිසි බලධරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරතහොත් (1) වන ඡේදයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඒ හෝටලයේ යම් සේවකයකු වරදකරු කරනු ලැබීමේ හේතුව පිට එම ඡේදය යටතේ ඒ හෝටලයේ ලියා පදිංචි කිරීම පිළිබඳව කිසිදු අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් නොකළ යුතුය.

(3) (අ) ලියා පදිංචි කරනු ලැබූ යම් සංචාරික හෝටලයක බලපත්‍රය අත්හිටුවමින් හෝ අවලංගු කරමින් නිසි බලධරයා විසින් මේ කොටස යටතේ කරනු ලැබූ යම් නියම සහතික පිටපතක් ඒ හෝටලයේ ලියාපදිංචි අයිතිකරු වෙත භාර දීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

(ආ) ඒ හෝටලයේ ලියා පදිංචි අයිතිකරු වෙත භාරදෙනු ලබන අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියමයක සෑම සහතික පිටපතකම එසේ අත්හිටුවමින් හෝ අවලංගු කරමින් නියමයක් කිරීම සඳහා වූ ඔහුගේ හේතු ඇතුළත් විය යුතුය.

සංචාරික හෝටලයක ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක අදාළ වන විශෙෂ විධිවිධාන.

31. (1) සංචාරික හෝටලයක ලියා පදිංචි කිරීම අවලංගු කරනු ලැබූ අවස්ථාවක, නිසි බලධරයා විසින් මේ කොටස යටතේ ඒ හෝටලය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් බල සහිතව තිබීම අවසාන වූ ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතුය.

(2) යම් සංචාරික හෝටලයක ලියා පදිංචි කිරීම නිසි බලධරයා විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ අත්හිටුවනු ලැබූ අවස්ථාවක නිසි බලධරයා විසින් මේ කොටස යටතේ ඒ හෝටලය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාල සීමාව තුළ බල රහිත විය යුතුය.

බලපත්‍ර ආදිය සඳහා වූ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අදල වන විශෙෂ විධිවිධාන.

32. ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් සඳහා බල පත්‍රයක් සම්බන්ධයෙන් වූ ඉල්ලීමක් ප්‍රතික්ෂෙප කරමින් හෝ එබඳු බලපත්‍රයක් අත්හිටුවමින් හෝ අවලංගු කරමින් හෝ යම් නියමයක් කිරීමට පෙර, නිසි බලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ ඒ බලපත්‍රය දරන්නාට, තමා විසින්ම හෝ ඒ වෙනුවෙන් තමා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ කරුණු දක්වීමට අවස්ථාවක් දිය යුතුය.

ඇතැම් අවස්ථාවල බලපත්‍රවල විස්තර නිවැරදි කිරීම.

33. ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයකට අදළ යම් ලියා පදිංචි කිරීමේ සටහනක විස්තර නිසි බලධරයා විසින් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රතිශෝධනය කරනු ලැබූ අවස්ථාවක ඊට අදළ බලපත්‍රයෙහි අනුරූප සංශෝධන කිරීමට තමාට හැකිවන පරිදි, තමා වෙත ඒ බලපත්‍රය ආපසු එවීමට ඒ හෝටලයේ ලියා පදිංචි කළ අයිතිකරුට ඒ බලධරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කළ හැකිය. ඒ නියමයෙහි සඳහන් කාල සීමාව ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම, ඒ අයිතිකරුගේ යුතුකම වන්නේය.

## V වැනි කොටස

### වර්ග කිරීමේ කාරක සභාව

වර්ග කිරීමේ කාරක සභාව සංස්ථාපනය කිරීම.

34. (1) මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලබන යොමු කිරීම් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් කලින් කලට පත්කරනු ලබන සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත (මේ නියෝගවල ''කාරක සභාව'' යනුවෙන් හැඳින්වෙන) වර්ග කිරීමේ කාරක සභාවක් පත්කරනු ලැබිය යුතුය.

(2) යටත් පිරිසෙයින් කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනකුවත්, මණ්ඩලය විසින් සුදුසුයයි සලකනු ලබන, හෝටල් කර්මාන්ත ව්‍යාපාරයෙහි යෙදී සිටින මණ්ඩල හෝ පුද්ගලයන් විමසා තෝරාගත යුතුය.

(3) (2) වැනි ඡෙදය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු නොවන කාරක සභාවේ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු, මණ්ඩලය විසින් (මේ නියෝගවල ''සභාපති'' වශයෙන් හැඳින්වෙන) කාරක සභාවේ සභාපති වශයෙන් පත්කළ යුතුය.

(4) කාරක සභාවේ සෑම සාමාජිකයකුම, මිය යාමෙන්, තමා විසින් කලින් නිලයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ මණ්ඩලය විසින් නිලයෙන් පහ කරනු ලැබීමෙන් නිලය හිස් කරතහොත් මිස අවුරුදු දෙකක කාලයක් නිලය දැරිය යුතුය. කාලය ඉකුත්වීම හේතුකොටගෙන නිලයෙන් අස්වන කාරක සභාවේ යම් සාමාජිකයකු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසු වන්නේය.

එසේ වුවද, තමාගේ නිල කාලය ඉකුත්වීමට පෙර කාරක සභාවේ සාමාජිකත්වය කෙළවර කළ තැනැත්තකු වෙනුවට පත්කරනු ලබන සාමාජිකයකු, කලින් නිලයෙන් ඉවත් වුවහොත් මිස, තමා අනුප්‍රාප්ත වූයේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ඉකුත් නොවූ නිල කාලය සඳහා නිලය දැරිය යුතුය.

ලේකම්වරයා පත්කිරීම

35. මණ්ඩලය විසින් කාරක සභාවට (මෙහි මින්මතු ''ලේකම්වරයා'' යනුවෙන් හැඳින්වෙන) ලේකම්වරයකු පත් කළ යුතුය.

කාරක සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

36. සංචාරක කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව, කාරක සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

කාරක සභාවේ රැස්වීම.

37. (1) කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති යොමු කිරීම් නිශ්චය කිරීම සඳහා, කාරක සභාවේ, සභාපතිවරයාගේ නියමය අනුව, ලේකම්වරයා විසින්, කාරක සභාවේ රැස්වීම් කැඳවිය යුතුය.

(2) කාරක සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයින් හතර දෙනකුගෙන් සමන්විත විය යුතුය.

(3) කාරක සභාවේ සෑම රැස්වීමකම මුලසුන කාරක සභාවේ සභාපතිවරයා විසින් දැරිය යුතුය. කාරක සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, රැස්වීමට පැමිණ සිටින කාරක සභාවේ සාමාජිකයන් විසින්, 34 (2) වැනි නියෝගය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු නොවන යම් සාමාජිකයකු තමන් අතුරින් ඒ රැස්වීමේ සභාපතිවරයා වශයෙන් තෝරාගත යුතුය.

(4) කාරක සභාව වෙත කරනු ලැබූ යොමු කිරීමක් කෙරෙහි සම්බන්ධතාවක් දක්වන තැනැත්තකු වන හෝ යොමු කිරීම කෙරෙහි සම්බන්ධතාවක් දක්වන පාර්ශ්වය විසින් නැතහොත් පාර්ශ්වය වෙනුවෙන් ඒ කාරණය සම්බන්ධයෙන් අධිනීතිඥයකු හෝ නීතිඥයකු වශයෙන් උපදෙස් විමසනු ලැබූ තැනැත්තකු වන කාරක සභාවේ සාමාජිකයකු, ඒ යොමු කිරීම නිශ්චය කරනු ලබන කාරක සභා රැස්වීමකට සහභාගි නොවිය යුතුය.

(5) කාරක සභාවේ රැස්වීමක් කලින් කලට කල් දැමීම හෝ අඛාලව කල් දැමීම කළ හැකිය.

කාරක සභාව වෙත කෙරෙන යොමු කිරීම්.

38. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිසි බලධරයා විසින් කාරක සභාව වෙත කරනු ලැබූ සෑම යොමු කිරීමකදීම —

(අ) ඒ යොමු කිරීම ලියවිල්ලකින් විය යුතුය.

(ආ) ඒ යොමු කිරීමෙහි විෂය පිළිබඳව නිරවුල් හා කෙටි ප්‍රකාශයන්ද එයට මුල් වූ හේතු ද එහි ඇතුළත් විය යුතුය. තවද,

(ඇ) ඒ යොමු කිරීම සම්බන්ධයෙන් කාරක සභාවෙන් බලාපොරොත්තු වන තීරණයේ ස්වභාවය එහි සඳහන් විය යුතුය.

(2) සෑම යොමු කිරීමක්ම, කාරක සභාවේ සභාපති වෙත යොමු කළ යුතු අතර, එය කාරක සභාවේ ලේකම්වරයා වෙත එවීම හෝ භාරදීම කළ යුතුය.

කාරක සභාවෙහි නීති කෘත්‍ය.

39. (1) කාරක සභාව වෙත කරනු ලැබූ සෑම යොමු කිරීමක්ම, කාරක සභාවේ රැස්වීමකදී නිශ්චය කරනු ලැබිය යුතුය.

(2) එබඳු යොමු කිරීමක් කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන දිනය, වේලාව හා ස්ථානය සභාපති විසින් නියම කොට, ඒ පිළිබඳව සම්පූර්ණ දින දහයක ලිඛිත දැන්වීමක් ලේකම්වරයා මාර්ගයෙන් නිසි බලධරයා වෙත හා ඒ යොමු කිරීම කෙරෙහි සම්බන්ධතාවක් දක්වන පාර්ශ්වය වෙත භාරදිය යුතුය.

(3) කාරක සභාව වෙත කරනු ලැබූ යම් යොමු කිරීමක් නිශ්චය කිරීමට නියමිත කාරක සභා රැස්වීමට නිසි බලධරයා සහ ඒ යොමු කිරීමට සම්බන්ධතාවක් දරන පාර්ශ්වය තමන් විසින්ම හෝ තමන් විසින් ලියවිල්ලකින් නිසියාකාර බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ හෝ නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ සහභාගි විය යුතුය. කාරක සභාවේ සභාපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ යුක්ති සහගත කරුණක් නිසා, ඒ බලධරයාට හෝ පාර්ශ්වකරුට ඒ රැස්වීමට සහභාගිවීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන දිනයකට ඒ කාර්‍යය සඳහා වූ රැස්වීම ඔහු විසින් කල් දැමිය හැකිය.

(4) රැස්වීමකට පැමිණි සිටින කාරක සභාවේ සාමාජිකයන්ගෙන් වැඩි දෙනකුගේ තීරණය කාරක සභාවේ තීරණය වශයෙන් සැලකිය යුතුය. සම ඡන්ද සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක මුලසුන දරන සාමාජිකයාට අතිරේක හෝ තීරණ ඡන්දයක් තිබිය යුතුය.

(5) කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන සෑම යොමු කිරීමක් සම්බන්ධයෙන් ඒ යොමු කිරීම පිළිබඳව කාරක සභාව ඉදිරියෙහි පැවැත්වෙන සියලුම කාර්ය පිළිබඳ වාර්තාවක් ලේකම්වරයා විසින් තැබිය යුතුය.

(6) කාරක සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් කාරක සභාවේ යම් ක්‍රියාවක් හෝ කාර්යයක් අවලංගු වන ලෙස නොසැලකිය යුතුය.

කාරක සභාව ඉදිරියෙහි පැවැත්වෙන කාර්‍ය පටිපාටිය හා පරිවය සහ පරීක්ෂා කිරීමේ බලය.

40. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලැබූ යම් යොමු කිරීමක් නිශ්චය කිරීමේ කාර්‍යය සඳහා කාරක සභාව විසින් සංචාරක හෝටලයක අයිතිකරුට දැන්වීමක් කොට ඒ හෝටලයේ ගොඩනැගිලි සහ භූමි භාගය පරීක්ෂා කළ හැකිය. එවැනි පරීක්ෂණයකදී ආහාර හෝ පාන සඳහා වූ මිල ගෙවා ඒවායේ රසය පරීක්ෂා කළ හැකිය.

(2) (1) වැනි ඡෙදයෙහි සඳහන් යම් ස්ථානයක අයිතිකරු හෝ එය භාරව සිටින යම් තැනැත්තකු විසින්, කාරක සභාවට මේ නියෝගය යටතෙහි ස්වකීය බලතල පාවිච්චි කිරීමට අවශ්‍ය සියලු පහසුකම්, සැලැස්විය යුතුය.

(3) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කාරක සභාව වෙත කරනු ලැබූ යම් යොමු කිරීමක් සම්බන්ධයෙන් කාරක සභාව ඉදිරියෙහි පැවැත්වෙන කාර්ය පරිපාටිය, අධිකරණයකට සාමාන්‍යයෙන් හා ස්වභාවයෙන් අදාළ වන කාර්‍යය පරිපාටිය හා සාක්ෂි පිළිබඳ නීතිවල විධිමත් භාවයෙන් හා රීත්‍යානුකූලත්වයෙන් හැකිතාක් දුරට නිදහස් විය යුතු අතර, විමර්ශණය කරනු ලබන කරුණු ඔප්පු කිරීමෙහි ලා අතිශයින්ම යෝග්‍යයයි කාරක සභාවට පෙනී යන්නාවූ ද ස්වභාවික යුක්තියේ මූලධර්මවලට පටහැනි නොවන්නා වූ ද ආකාරයකට කාරක සභාව විසින් පැවැත්විය හැකිය.

කාරක සභාවේ තීරණය පිළිබඳ දැන්වීම් භාරදීම.

41. මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කාරක සභාව වෙත කරනු ලැබූ යම් යොමු කිරීමක් සම්බන්ධයෙන් එහි තීරණය පිළිබඳ දැන්වීමක් නිසි බලධරයාට ද ඒ යොමු කිරීම පිළිබඳව සම්බන්ධතාවක් දක්වන පාර්ශ්වය වෙතද භාරදීමට කාරක සභාව විසින් කටයුතු සැලැස්විය යුතුය.

යොමු කිරීමක් සම්බන්ධයෙන් කාරක සභාවේ තීරණය ක්‍රියාත්මක කිරීම නිසි බලධරයාගේ යුතුකම බව.

42. කාරක සභාව වෙත කරනු ලැබූ යොමු කිරීමක් සම්බන්ධයෙන් කරනු ලැබූ යම් තීරණයක් පිළිබඳව දැන්වීමක් ලැබුණුවිට ඒ තීරණය සම්පූර්ණයෙන් බලසහිත හා ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර නිසි බලධරයා විසින් ගත යුතුය.

වර්ග කිරීමේ කාරක සභාවේ සාමාජිකයින් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

43. කාරක සභාවේ සාමාජිකයන්, දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථය අනුව, රජයේ සේවකයන් වශයෙන් සලකනු ලබන්නේය.

## (VI) වැනි කොටස

### සාමාන්‍ය කරුණු

ලියා පදිංචි කරනු ලැබූ සංචාරක හෝටලයක් පරීක්ෂා කිරීමේ බලය,

44. (1) ලියාපදිංචි කරනු ලැබූ සංචාරක හෝටලයක් විසින් මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරන්නේද යන්න නිශ්චය කිරීමේ කාර්‍යය සඳහා, මණ්ඩලය, මණ්ඩලයේ සභාපති, මණ්ඩලයේ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන මණ්ඩලයේ සාමාජිකයකු, නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලය යටතේ ක්‍රියා කරන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ පදවියට නොඅඩු ධුරයක් දරන යම් තැනත්තකු හෝ විසින්, ඒ හෝටලයේ අයිතිකරුට හෝ එය භාරව සිටින යම් තැනැත්තකුට ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසුව,—

(අ) ඒ කාර්යයන්ට අදාළ සියලුම කරුණු හා දේවල් සොයා දැනගැනීමේ අදහසින් ඒ හෝටලයේ ගොඩනැගිලි සහ භූමිභාගය පරීක්ෂා කිරීම,

(ආ) 58 වැනි නියෝගය යටතේ පවත්වාගෙන යාමට නියමිත ලේඛනය ඉදිරිපත් කිරීමට ඒ හෝටලය භාර යම් තැනැත්තකුට නියම කිරීම,

(ඇ) ඒ ලේඛනය පරීක්ෂා කිරීම හා එයින් පිටපත් හෝ උධෘත ගැනීම නීත්‍යානුකූල වන්නේය.

(2) මේ නියෝගය යටතේ ස්වකීය බලතල පාවිච්චි කිරීමෙහි ලා මණ්ඩලය විසින් නියම කරනු ලබන සියලු පහසුකම් මණ්ඩලයට, මණ්ඩලයේ සභාපතිට, මණ්ඩලයේ සාමාජිකයකුට, නිසි බලධරයාට හෝ ඒ ඡෙදයෙහි සඳහන් සහකාර අධ්‍යක්ෂ පදවියට නොඅඩු මණ්ඩලයේ නිලධරයකුට (1) වැනි ඡෙදයෙහි සඳහන් යම් ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තකු විසින් සැලසිය යුතුය.

අවසරපත්‍රවලට හෝ බලපත්‍රවලට හෝ ලියා පදිංචි කිරීමට හෝ අදාළ නියම හෝ කොන්දේසි ආදිය වෙනස් කිරීමේ බලය.

45. (1) නිසි බලධරයා විසින් තමන්ගේම ඕනෑකමින් හෝ යම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන තැනැත්තා විසින් තමන් වෙත කරනු ලැබූ කරුණු ඉදිරිපත් කිරීමක් අනුව හෝ, ඒ අවසර පත්‍රයට හෝ බලපත්‍රයට යාකොට තිබෙන යම් නියමයක් හෝ කොන්දේසියක් ඒ අවසර පත්‍රය හෝ බලපත්‍රය දරන තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීමෙන් පසු සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය. එසේ නැතහොත් එයට යම් අලුත් නියමයක් හෝ කොන්දේසියක් එකතු කළ හැකිය.

(2) නිසි බලධරයා විසින් තමන්ගේම ඕනෑකමින් හෝ ලියාපදිංචි කරනු ලැබූ සංචාරක හෝටලයක ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරු විසින් ඒ වෙනුවෙන් තමන් වෙත කරනු ලබන කරුණු ඉදිරිපත් කිරීමක් අනුව හෝ ඒ හෝටලයේ ලියාපදිංචි කිරීමට අදාළ කොට තිබෙන යම් නියමයක් හෝ කොන්දේසියක්, එසේ ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීමෙන් පසු, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය. එසේ නැතහොත් එයට යම් අලුත් නියමයක් හෝ කොන්දේසියක් එකතු කළ හැකිය.

අවසර පත්‍ර හෝ ලියාපදිංචි කිරීම හෝ බලපත්‍ර හෝ සඳහා ඉල්ලුම් කරන්නන් විසින් සැපයිය යුතු බවට ඔවුන්ට නියම කිරීමට නිසි බලධරයාට ඇති බලය.

46. ලියාපදිංචි කිරීම සඳහා හෝ අවසර පත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් සඳහා හෝ යම් තැනැත්තකු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති විටක, නිසි බලධරයා විසින්, නියමයක් මගින්, ඒ ඉල්ලුම් පත්‍රය පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා තමාට අවශ්‍ය විය හැකිවූද ඉල්ලුම් පත්‍රයෙහි නිශ්චිතව සඳහන් විස්තරවලට අදාළ උපදෙස්වල දක්වා ඇත්තාවූද තොරතුරු හෝ ලේඛන තම නියමයෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡෙදය ඇතුළත දී තමා වෙත සපයන ලෙස එකී ඉල්ලුම්කරුට නියම කළ හැකිය. තවද ඉල්ලුම්කරු ඒ නියමයට අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් ඒ බලධරයා විසින් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකිය.

සාමාන්‍ය වශයෙන් තැනැත්තන්ගෙන් තොරතුරු ලබා ගැනීමට හා පරීක්ෂණ පැවැත්වීමට නිසි බලධරයාට ඇති බලය.

47. (1) නිසි බලධරයා විසින්,—

(අ) පහත සඳහන් කාර්‍යයන් සඳහා අවශ්‍ය තොරතුරු, එනම්, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා හෝ, එවැනි ඉල්ලීමක සඳහන් යම් විස්තරවල හෝ මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඒ වෙනත් තැනැත්තා විසින් සපයනු ලැබූ හෝ දෙනු ලැබූ යම් වාර්තාවක හෝ තොරතුරක නිවැරදිතාව සොයා ගැනීම සඳහා හෝ, යම් ලියා පදිංචි කිරීමක් හෝ යම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා, නියමයෙහි සඳහන් කාලසීමාව ඇතුළත, එසේ නියමිත තමන් දන්නා එබඳු තොරතුරු ඒ බලධරයා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට නියම කළ හැකිය; තවද

(ආ) එබඳු යම් කාර්යයක් සඳහා අවශ්‍ය එබඳු සියලු විමර්ශණ කලින් කල පැවැත්විය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡෙදය යටතේ නියමයක් ලැබූ යම් තැනැත්තකු විසින්, එහි සඳහන් කාලසීමාව ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කළ යුතුය.

දිවුරුම හෝ ප්‍රතිඥාව.

48. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 44 වැනි නියෝගයේ සිට 47 වැනි නියෝගය දක්වා වූ නියෝගවලින් හා 58 (2) වැනි නියෝගයෙන් පවරනු ලැබූ බලපත්‍ර ක්‍රියාවේ යොදවන සියලුම තැනැත්තන් විසින්, එකී නියෝගවල සඳහන් යුතුකම් ඉටු කරන අවස්ථාව තුළදී හෝ ඉටු කිරීමේදී ඔහුට හෝ ඔවුන්ට දැනගන්නට ලැබෙන හෝ දැනගන්නට ලැබිය හැකි යම් කරුණක්, සිද්ධියක් හෝ දෙයක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, ඔහු හෝ ඔවුන් විසින් දැඩි රහස්‍යතාව රකින බවට, අවස්ථාවෝචිත පරිදි, දිවිරීමෙන් හෝ ප්‍රකාශ කිරීමෙන් හා සහතික කිරීමෙන්, මණ්ඩලය විසින් නියම කරනු ලබන ආකෘතිය අනුව හා උපචාර සමග නිල දිවුරුමක් ප්‍රතිඥාවක් දිය යුතුය.

ඇතැම් ලියාපදිංචි කිරීම්, අවසර පත්‍ර හෝ බලපත්‍ර අවලංගු බව හා වංචනික නියෝජනය සඳහා දඬුවම.

49. (1) ව්‍යාජ නියෝජනයකින් හෝ වංචනික ලෙස හෝ ලබාගත් යම් ලියා පදිංචි කිරීමක් හෝ යම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා වලංගු හෝ බල සහිත හෝ නොවන්නේය.

(2) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලියා පදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබාගත යුතු සංචාරික හෝටලයක ව්‍යාපාරය, සාවද්‍ය හෝ වංචනික නියෝජන හෝ වෙනත් ලිඛිත කරුණු දැක්වීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් හෝ දැක්වීමට නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්වීමෙන්, ලබාගන්නා හෝ ලබා ගැනීමට ප්‍රයත්න දරන යම් තැනැත්තෙක් හා ඔහුට ආධාර හා අනුබල දෙන සෑම තැනැත්තෙක්ම වරදක් කරන්නෙක් වන්නේය.

ලියා පදිංචි කිරීමේ හෝ බලපත්‍රවල හෝ අවසර පත්‍ර වල හෝ නියම හෝ කොන්දේසි අනුගමනය කිරීම යුතුකමක් බව.

50. ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක ලියා පදිංචි කළ අයිතිකරු හෝ යම් අවසර පත්‍රයක් නැතහොත් බලපත්‍රයක් දරන්නකු හෝ විසින් ඒ ලියාපදිංචි කිරීමේ හෝ අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ සෑම නියමයක්ම හෝ කොන්දේසියක්ම අනුව ක්‍රියා කළ යුතුය.

අවසර පත්‍ර හෝ බලපත්‍ර අන්සතු කළ නොහැකි බව.

51. අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ අවසර පත්‍රය හෝ බලපත්‍රය වෙනත් තැනැත්තකුට පැවරීම හෝ අන්සතු කිරීම නොකළ යුතුය. මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරමින් කරනු ලැබූ එවැනි යම් පැවරීමක් හෝ අන්සතු කිරීමක් අවලංගු හා බලරහිත වන්නේය.

ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක් වශයෙන් ඇඟවීම වරදක් බව.

52. (1) ලියා පදිංචි නොකරනු ලැබූ කිසිම හෝටලයක් විසින්—

(අ) " සංචාරික හෝටලය " හෝ " ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලය " යන වචන ප්‍රදර්ශනය කිරීම හෝ තනිකරම හෝ වෙනත් වචනයක් හෝ අකුරු සමඟ හෝ " සංචාරික හෝටලය " යන වචන අඩංගු වන යම් නමක් හෝ අභිධානයක් ප්‍රදර්ශනය කිරීම ; හෝ

(ආ) එය සංචාරික හෝටලයක් හෝ ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් හෝ බව ඇඟ වෙන යම් නමක්, අභිධානයක් එකතු කිරීමක් හෝ විස්තරයක් භාවිත කිරීම ; හෝ

(ඇ) 4(1) වැනි නියෝගයේ සඳහන් යම් සංකේතයක් භාවිතා කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ එවැනි සංකේතයක අනුකරණයක් බව පැහැදිලිවම පෙනෙන සංකේතයක් හෝ ව්‍යාජ සංකේතයක් භාවිතා කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

(2) ලියා පදිංචි කළ සංචාරික හෝටලයක් නොවන යම් හෝටලයක් විසින් " සංචාරික හෝටලය " හෝ " ලියා පදිංචි කළ සංචාරික හෝටලය " යන වචන හෝ " සංචාරික හෝටලය " යන වචන ඇතුළත් වන යම් නාමයක් හෝ අභිධානයක් හෝ ඉහත ඡේදයේ සඳහන් යම් සංකේතයක්, ඒ හෝටලයේ නමද දැක්වෙන යම් අත් පත්‍රිකාවක, දැන්වීම් පත්‍රිකාවක, ප්‍රචාරක පත්‍රිකාවක, දැන්වීමක, විස්තරයක, ලාංඡනයක හෝ අන් කවර නමකින් වුවද හැඳින්වෙන යම් දෙයක හෝ ලේඛනයක හෝ එවැන්නක් මත යෙදුවහොත්, ඒ හෝටලය, මේ නියෝගයේ කාර්ය සඳහා, " සංචාරික හෝටලය " යන වචන හෝ " ලියා පදිංචි කළ සංචාරික හෝටලය " යන වචන ඇතුළත් වන යම් නාමයක් හෝ අභිධානයක් හෝ ඉහත ඡේදයේ සඳහන් යම් සංකේතයක් හෝ පාවිච්චි කරන හෝටලයක් ලෙස සලකනු ලැබේ.

(3) ලියා පදිංචි නොකළ සංචාරික හෝටලයක් වන හෝටලයක් සම්බන්ධයෙන් මේ නියෝගයේ ඉහතින් දැක්වූ විධිවිධාන කඩකිරීමේ හේතුවෙන් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබ ඇති විට, ඒ හෝටලයේ අයිතිකරු සහ එවකට එහි භාරකාරත්වය දරන තැනැත්තා ඒ වරද කළ වරදකරුවෝ වෙති.

අවසර පත්‍ර ආදියෙහි අනු පිටපත්.

53. (1) ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයකට අදාළ ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික පිටපත හෝ ඒ හෝටලයට අදාළ තමන්ගේ බලපත්‍රය හෝ නැති වූ, ඒ සංචාරික හෝටලයේ ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරු විසින්, අනු පිටපත සඳහා නියමිත ගාස්තු ගෙවීමෙන් පසු නිසි බලධරයාගෙන් එහි අනුපිටපතක් ලබාගත හැකිය.

(2) තමාගේ අවසර පත්‍රයෙහි පිටපත නැතිකර ගත් යම් අවසර පත්‍රයක් දරන්නකු විසින්, අනුපිටපත සඳහා නියමිත නිසි ගාස්තුව ගෙවීමෙන් පසු, නිසි බලධරයාගෙන් එහි අනුපිටපතක් ලබාගත හැකිය.

නියමිත නිවේදිත ගාස්තුව.

54. නිසි බලධරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නිවේදනයක මාර්ගයෙන්, අවසර පත්‍ර, බලපත්‍ර හෝ ලියා පදිංචි කිරීම් සඳහා හෝ අවසර පත්‍රවල හෝ බලපත්‍රවල අනුපිටපත් හෝ ලියා පදිංචි කිරීමේ සටහන්වල සහතික පිටපත් සඳහා ගෙවිය යුතු ගාස්තුව කලින් කලට නියමකළ හැකිය. එවැනි යම් නිවේදනයක් එබඳු නිවේදනයක් මඟින් සංශෝධනය කිරීම, ඉවත් කිරීම හෝ ආදේශ කිරීම එවැනි බලධරයකු විසින් කළ හැකිය.

දැන්වීම්, ලේඛන ආදිය භාරදීම

55. (1) යම් තැනැත්තකුට භාරදීමට හෝ නිකුත් කිරීමට මේ ව්‍යවස්ථා මාලාවෙන් නියමිත හෝ බලය පවරනු ලැබූ යම් ලේඛනයක්, ඒ තැනැත්තාට පුද්ගලිකව භාර දෙනු නොලැබුවහොත් හෝ නිකුත් කරනු නොලැබුවහොත්, එය ඔහුගේ අන්තිමට දැන සිටි වාසස්ථානය හෝ ව්‍යාපාර ස්ථානය වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලබන ලිපියකින් යවනු ලැබුවේ නම් එය ඔහුට නිසියාකාර භාර දෙනු ලැබූ ලෙස හෝ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

(2) මේ නියෝගයෙහි " ලේඛනය " යන්නෙන් යම් ආඥාවක, යම් අවසර පත්‍රයක හෝ බලපත්‍රයක, යම් නියමයක, යම් දැන්වීමක හෝ වෙනත් කුමන නාමයකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන වෙනත් යම් ලේඛනයක යම් පිටපතක් අදහස් වේ.

වැරදි.

56. (1) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන්නෙක් වන්නේය.

(2) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දෙනු ලැබූ බලපත්‍රයක් දරන සංචාරික හෝටලයක ලියා පදිංචි කරනු ලැබූ අයිතිකරුවකුගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු විසින් කරන ලද යම් වරදක්, තම දැනීමෙන් තොරව ඒ වරද සිදුකරන ලද බවට හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට නිසි බලධරයා සෑහීමට පත්වන අයුරු ඒ බලපත්‍ර දරන්නා ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද ඒ බලපත්‍රය දරන්නා විසින් කරන ලද වරදක් ලෙස සලකනු ලැබේ.

සංචාරිකයන් විසින් ගෙවීම් කරනු ලබන හා ලියාපදිංචි කළ සංචාරික හෝටල විසින් ඒ ගෙවීම් ලබන ක්‍රමය හා ආකාරයට අදාළ විශේෂ විධිවිධාන.

57. (1) ලියා පදිංචි කරනු ලැබූ යම් හෝටලයක් විසින් සලසනු ලබන සේවාවන් හා පහසුකම් වෙනුවෙන් සංචාරකයින් විසින් ඒ හෝටලයට ගෙවීම් කරනු ලබන ක්‍රමය හා ආකාරයද ඒ හෝටලය විසින් ඒ ගෙවීම භාරගන්නා ක්‍රමය හා ආකාරයද, නිසි බලධරයා විසින් කලින් කල ඒ වෙනුවෙන් නිකුත් කරනු ලැබිය හැකි යම් විධාන අනුව විය යුතුය.

(2) මේ නියෝගයේ (1) ඡෙදය යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන යම් විධානයක්, මුදල් නීති පනතේ හෝ විනිමය පාලන පනතේ හෝ ඒවා යටතේ පනවන ලද යම් උපකාරක නීතියක හෝ විධිවිධාන ඇත්නම් ඒ විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතුය.

(3) ලියා පදිංචි කරන ලද යම් සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් මේ නියෝගයේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමේ හේතුව නිසා මේ පනත යටතේ යම් වරදක් සිදුකර ඇති අවස්ථාවක, ඒ හෝටලයේ අයිතිකරුද (1) වැනි ඡෙදයෙහි සඳහන් ගෙවීම ඇත්ත වශයෙන්ම ඉල්ලා සිටි හෝ ඒ ගෙවීම භාරගත් තැනැත්තා ද යන දෙදෙනාම ඒ වරදකරුවෝ වෙති.

අයිතිකරු විසින් ලේඛන හා පොත් තැබිය යුතු බව හා වාර්තා සැපයිය යුතු බව.

58. (1) ලියාපදිංචි කරන ලද සංචාරික හෝටලයක අයිතිකරු විසින් පහත සඳහන් විස්තර අඩංගු ලේඛනයක් පවත්වාගෙන යා යුතුය :—

(අ) අමුත්තා පැමිණි දිනය හා වේලාව ;
(ආ) අමුත්තාගේ නම ;
(ඇ) විදේශ ගමන් බලපත්‍රයේ අංකය ;
(ඈ) ජාතිය ;
(ඉ) කාමර අංකය ;
(ඊ) අමුත්තාගේ ස්ථිර ලිපිනය ;
(උ) ඔහුගේ ලියුම් යැවිය යුතු ඊලඟ ලිපිනය ;
(ඌ) අමුත්තා නික්ම ගිය දිනය හා වේලාව ;
(එ) බිල්පත්‍රයේ ගණන හා ගෙවීම කරන ලද ව්‍යවහාර මුදල් වර්ගය ;
(ඒ) අමුත්තාගේ අත්සන ;
(ඔ) නිසි බලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු.

(2) ලියාපදිංචි කරනු ලැබූ යම් සංචාරික හෝටලයක අයිතිකරු විසින් වරින් වර හා මණ්ඩලය, මණ්ඩලයේ සභාප,ති මණ්ඩලයේ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන මණ්ඩලයේ සාමාජිකයකු, නිසි බලධරයා හෝ ඒ බලධරයා වෙනුවෙන් ක්‍රියා කරන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු හෝ විසින් නියම කරනු ලැබූ යම් අවස්ථාවක, ඒ අයිතිකරු විසින් පවත්වාගෙන යනු ලබන පොත්වල හා වාර්තාවල සහතික කරනු ලැබූ උධෘත හෝ එබඳු තොරතුරු වල වාර්තා සැපයිය යුතුය.

අර්ථ නිරූපනය.

59. මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පද සම්බන්ධයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

යම් ලියා පදිංචි කිරීමක, යම් අවසර පත්‍රයක, යම් බලපත්‍රයක හෝ ලියාපදිංචි කිරීමේ සටහනක, හෝ යම් අවසර පත්‍රයක හෝ යම් බලපත්‍රයක පිටපතක යම් අනුපිටපතක කාර්යයන් සඳහා, '' නිසි නියමිත ගාස්තුව '' යන්නෙන් 54 වැනි නියෝගය යටතේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ නිවේදනයකින් නිසි බලධරයා විසින් ඒ කාර්යයන් සඳහා නියම කරනු ලැබූ ගාස්තුව අදහස් වේ ;

'' නිසි බලධරයා '' යන්නට පනතෙහි දී ඇති අර්ථයම ඇත ;

'' බලපත්‍රය '' යන්නෙන් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් අදහස් වේ;

'' අවසර පත්‍රය '' යන්නෙන් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිසි බලධරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් අදහස් වේ ;

'' ලියා පදිංචි කරනු ලැබූ '' යන්නෙන්, ලේඛනය ලියා පදිංචි කරනු ලැබූ බව අදහස් වෙයි.

'' ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලය '' යන්නෙන්,එක්තරු සංචාරික හෝටලයක් වශයෙන් හෝ දෙතරු සංචාරික හෝටලයක් වශයෙන් හෝ තුන් තරු සංචාරික හෝටලයක් වශයෙන් හෝ සිව් තරු සංචාරික හෝටලයක් වශයෙන් හෝ පස් තරු සංචාරික හෝටලයක් වශයෙන් ලියා පදිංචි කරනු ලැබූ සංචාරික හෝටලයක් අදහස් වන අතර, ලියා පදිංචි කරනු ලැබූ එක්තරු සංචාරික හෝටලය, ලියා පදිංචි කරනු ලැබූ දෙතරු සංචාරික හෝටලය, ලියා පදිංචි කරනු ලැබූ තුන් තරු සංචාරික හෝටලය, ලියා පදිංචි කරනු ලැබූ සිව් තරු සංචාරික හෝලය හා ලියා පදිංචි කරනු ලැබූ පස් තරු සංචාරික හෝටලය යන පද ඒ අනුව තේරුම් ගත යුතුය ;

'' නියෝගය '' යන්නෙන්, මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි සඳහන් නියෝගයක් අදහස් වේ ;

සංචාරික හෝටලයක් සම්බන්ධයෙන් '' තාරකා පංතිය '' යන්නෙන්, ඒ හෝටලයට අදාළ ලියා පදිංචි කිරීමේ සටහනෙහි ඒ හෝටලයට දෙනු ලැබූ තාරකා පංතිය අදහස් වේ ;

'' පනත '' යන්නෙන්, 1968 අංක 14 දරණ සංචාරික සංවර්ධන පනත අදහස් වේ.

'' මණ්ඩලය '' යන්නෙන් 1966 අංක 10 දරණ ලංකා සංචාරික මණ්ඩල පනත යටතේ පිහිටුවා සංස්ථාපනය කරන ලද ලංකා සංචාරික මණ්ඩලය අදහස් වේ ;

'' අමාත්‍යවරයා '' යන්නෙන්, සංචාරික විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

අවලංගු කිරීම.

60. ලංකා සංචාරක මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබ, 1970 මාර්තු 10 වැනි දින අංක 14,896/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 සංචාරික හෝටල් ව්‍යවස්ථා, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

9–730/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

**49 ඡේදය යටතේ සහතිකය**

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනවල විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

මහ4/අත්/226
1973.9.7 දින,
කොළඹ දී ය.

### උපලේඛනය 1

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර කඩවත් සතර උප දිසාපති කොටසේ ගැටඹේ 42 බී ග්‍රාම සේවක වසමේ පිහිටි ප්‍රිම්රෝස් වත්තෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 1, පර්. 0 වූ කොටස.

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසේ පාර ;

දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසේ පාර ;

බටහිරට : තැපැල් දෙපාර්තමේන්තුවට අයිති ඉඩම (ඕ.සී.ඒ.ඩී. ඇස්.).

### උපලේඛනය 2

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර කඩවත් සතර උප දිසාපති කොටසේ ගැටඹේ 42 බී ග්‍රාම සේවක වසමේ පිහිටි ප්‍රිම්රෝස් වත්තෙන් අ. 0, රූ. 1, ප. 0 පමණ වූ අඩි 20ක් පළල සඳහා අත්පත් කරන කොටසට මායිම්.

උතුරට : මේබල් කුරේ මාවත ;

නැගෙනහිරට . මෙම ඉඩමේ ඉතිරි කොටස ;

දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

9–728—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා විසින් පහත නම් සඳහන් නිලධාරීන් ස්වකීය රාජකාරි වලට අතිරේකව, 1972 දෙසැම්බර් මස 1 වැනි දින සිට ආනයන හා අපනයන සහකාර පාලක වරුන් වශයෙන් සතුටින් පත් කරනු ලැබ සිටී.

(i) ශ්‍රී.ලං.ප.සේ. III වැනි පන්තියේ අර්වින් ජෝෂප් වික්‍රම මහතා, සහකාර කොමසාරිස් (පාලන) වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව.

(ii) සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ, කනපති පිල්ලේ කුමාරස්වාමි මහතා කාර්යාල සහකාර, වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව.

කේ. බී. දිසානායක,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
වැඩ බලන ලේකම්.

1973 සැප්තැම්බර් මස 10 වෙනි දින,
කොළඹ දී ය.

9–755—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනත

5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් 20 වෙනි දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ කලින් කළ සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උප ලේඛනයෙහි 'වයඹ පළාත—කුරුණෑගල දිස්ත්‍රික්කය' යන ශීර්ෂය යටතේ :—

(1) ගන්තිහේ කෝරලේ කොට්ඨාශයට අදාළ අංක 23 දරණ විෂය වෙනුවට මෙහි වූ 'අ' උප ලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන්, හා

(2) අංක 23 දරණ විෂයයට ඉක්බිතිව මෙහි 'ආ' උප ලේඛන යෙහි සඳහන් 23 අ දරණ විෂය ඇතුළත් කිරීමෙන්

1973. 10. 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 අගෝස්තු මස 27 දින,
කොළඹ දී ය.

#### 'අ' උපලේඛනය

23. පහත සඳහන් ගම්වලින් සමන්විත කිරිමැටියාව කොට්ඨාශය:—

අඹකොළවැව
අමුනුගම
බඩල් ගම
බෝගොඩගෙදර
දැනව
එගොඩයාගම
හලවැන් වත්ත
හීනුක් ගල
හිරිගොල් ලේ ගම
ජයලත් ගම
කඩහතගම
කයිරක් ගම
කිරිමැටියාව
කුඹුක්වැව
පහල අමුනුගම
පහලවත්ත
පාලුසියඹලැව
පන් නලයාගම
වැලිමිටියාගෙදර

#### 'ආ' උපලේඛනය

23අ. පහත සඳහන් ගම්වලින් සමන්විත අඹන්පොල කොට්ඨාශය :—

අඹගම්මන
අඹන් පොල
අලුත් වැව
අතපත්තු සියඹලැව
අටවරල
අටවරල
බඩබද් දැව
බමුණුගම
බමුණුගම
බඹර මිතෝගම
බෙරුවැව
බොරවැව
දෙමටැව
දෙමටගොල් ල
දිගන
දොඩන් ගොල් ලැව
දුම්බුලුවාව
ඇල් ලබඩගම
එරබුදුවැව
ගලවැව
ගනේගම
ගවරගනේ
ගැටදිවුල
ගැටදිවුල
ගැටිලාව
ගෝනගම
ගෝනමඩිත්ත
හම්මිල් ලකඩවල
හම්මිල් ලකොටුව
හැලඹැව
හෙට්ටිගම
හැවන් පොලගම
හිතෝකඩවල
හිරියාලයාගම
ඉහළ බක් මීවැව
ඉහල කුඩාවැව
ඉහල රනෝරුව
ඉහල උඩංගාව
ඉහල වල් පාලුව
ඉපලෝගම
කලුපෙරුමාව
කලුවිලපොතාන
කරඳගහවැව
කරඹේ
කරුවලගස් වැව
කාසිකොටේ
කටුපිටිගම
කිරිමැටිවත්ත
කිවුලේ ගම
කිවුල් ලැව
කොඳින් කට්ටුව
කොකටියාව
කෝන් කඩවල
කෝන් වැව
කොරකහගම
කොරොව්වේගම
කොස් සැත් තැව
කොටකිඹුලැව
කුඩාබැලුන් ගල
කුඩාපලුගස් වැව
කුකුලැව
කුඹුක් ගහවැව
කුඹුක්ගැටේ
කුරුන් දේ ගම
මඩදෙනිගම
මහදිවුල් වැව
මාම්පිටිගම
මාමුනුගම
මැතින් ගමුව
මැදගම
මූනමලේ ගම
නානැව
නවගත්ත
නැකිති කුඹුක්වැව
නැකති තරනගස් වැව
නැකති වඳුරුස්ස
නෙලුන් පත් තැව
නිකපිටිගම
නිකුන් නැව
පහල බක් මීවැව
පහල කුඩවත්ත
පහල කුඩාවැව
පහල මාතින් ගමුව
පහල වල් පාලුව
පහල බැලුන් ගල
පලාපත් වල
පනාදරගම
පානෝගම
පරපේ ගම
පාරසන් ගිලිගම
පත් තිනිගම
පිදුරුවැල් ලැව
පිල් ල
පොල් පිතිගම
පොතාන
පූස් සැල් ලේ ගම
රාලගෙවැව
රඹැව
රත් දෙනිගම
රනෝරුව
රොලව
තම්මැන් නාව
තම්මිටගම
තාඹරේ
තන් තිරියාව
උඩදිවුල් ලැව
උඩන් ගාව
උඩතම්මැන් නැව
උඩ වලලිය
උල් කෙන් දැව
ඌරුව
උස් සැව
වඳුරුස්ස
වලලිය
වල් පාලුව
වරාගම්මන
වේරහැරයාගම
වීරකැදවැව
වීරසෝලේ
යකා පලුගස් වැව
යාලුවැව
යන් තම්පලගම

9–785—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

**කොළ/දැලතුර රෝමානු කතෝලික සිංහල බාලිකා පාසැල—පමුණුගම**

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බද්උද්දීන් මහමුද් වන මම, වෂී 1961 කේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 13,258 හා 1962.08.10 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1047 දරණ පැවරුම් නියෝගයේ උප ලේඛනයේ පළමුවන ඡේදය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරමි.

උපලේඛනය

1960 ජූලි මස 21 වෙනි දින ඉහත බී, කොළ/දැලතුර රෝමානු කතෝලික සිංහල බාලිකා පාසැල පැවැත්වූවාවූත්, නඩත්තු කරනු ලැබූවාවූත් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලයේ, දැලතුරෙහි පිහිටි ස්ථානය, එනම් :—

උතුරෙන් : අඩි පහක් උසැති තාප්පයෙන් ද ;

නැගෙනහිරින් : අඩි පහක් උසැති තාප්පයෙන් හා පාසැල් ගොඩනැගිල්ලේ නැගෙනහිර බිත්තියේ කොටසකින් ද ;

දකුණෙන් : පාසල් ගොඩනැගිල්ලේ දකුණු බිත්තියේ සිට අඩි තුනක් දුරින් හා ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද ;

බටහිරින් : පාසල් ගොඩනැගිල්ලේ බටහිර බිත්තියේ සිට අඩි තුනක් දුරින් හා ඊට සමාන්තරව දිවෙන රේඛාවකින්, මෙම රේඛාවට පාසල් ගොඩනැගිල්ලේ උතුර බිත්තියේ සිට අඩි 3ක් දුරින් පිහිටි ලක්ෂයක් කරා උතුරට විහිද, එතැන් සිට නැගෙනහිරට හැරී අඩි 5ක් උසැති තාප්පය හමුවන තෙක් දිවෙයි. එතැන් සිට එම රේඛාව උතුරු මායිම හමුවන තෙක් තාප්පය දිගේ දිවෙයි. මෙම මායිම තුළ පිහිටි බිම් ප්‍රමාණය රූඩ් එකක් පමණ වේ.

මහා මාර්ගයේ සිට දේවස්ථාන භූමිය තුළින්, පාසලට පිවිසීමේ අයිතිය සහ, පාසලට උතුරෙන් පිහිටි ළිඳට යාමේ හා එය පාවිච්චි කිරීමේ අයිතිය.

බද්උද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

පාප/2/ඒ—78.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1973 සැප්තැම්බර් මස 11 දින,

9–802—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**1971 ක්වූ අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනත 39(1) වගන්තිය යටතේ ආඥාව**

වර්ෂ 1971 ක්වූ අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ 39(1) වගන්තියෙන් පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය හෙක්ටර් සෙනරත් රූපකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම, වී අලෙවි මණ්ඩලයේ ව්‍යාපාර කාර්යය සඳහා මේ සමග ඇති උපලේඛනයේ විස්තර කර ඇති දේපලෙහි යෝජිත අත්කර ගැනීම මෙම ආඥාවෙන් අනුමත කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස,
කොළඹ දී ය.

ඉහත සඳහන් උපලේඛනය

ඌව පළාතේ යටිකිඳ කෝරළේ බදුල්ල කඩවත් (ගැටවිස්) බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව සීමාව තුල, වෙලේ කඩේ අංක 7 දරන කොට්ඨාශයේ බදුල්ලේ පිහිටි උතුරට රජයට හිමි අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විද්‍යාල භූමිය සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ භූමියද, නැගෙනහිරට බදුල්ල-මහියංගනය පාර ද, දකුණට බදුල්ල-මහියංගනය පාර සහ කඳුකරද, බස්නාහිරට කඳුර සහ කුඹුරද යන මායිම් තුල රූඩ් 2, පර්චස් 16 ක් (අ. 0, රූ. 2, ප. 16) විශාල වරිපනම් අංක 57 දරණ දඹු අරාවේ වත්ත නමැති ඉඩම සහ එහි පිහිටා ඇති "බෑක්ලින්" නමින් හැඳින්වෙන ගෙය සහ එහි ඇති අනිකුත් සියලු දේ සම්පූර්ණ වශයෙනි.

9–708—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**1972 අංක 7 දරණ ගෙවල් කුලී පනත**

1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ 44 වැනි වගන්තිය යටතේ නිවාස හා ගොඩනැගිලි ඇමති පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මා විසින් පහත සඳහන් ආඥාව කරනු ලැබේ.

පී. බී. ජී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1973 සැප්තැම්බර් මස 13 දින,
කොළඹ දීය.

ආඥාව

නිවාස හා ගොඩනැගිලි ඇමති පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම 1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ කාර්යයන් සඳහා 1973.08.01 දින සිට පහත සඳහන් නිලධාරීන් බලයලත් නිලධාරීන් වශයෙන් මෙයින් ප්‍රකාශ කරමි. පනත යටතේ ඔවුන්ට පැවරෙන බලතල හා කාර්යයන් ක්‍රියාවේ යෙදවිය යුතු ප්‍රදේශ නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් නිශ්චිතව සඳහන් කර ඇත.

| ප්‍රදේශයන් | බලයලත් නිලධාරීන්ගේ නම් |
|---|---|
| 1. කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව ඇතුලත ප්‍රදේශය | ජේ. ජේ. රණසිංහ මහතා<br>එච්. බී. දිසානායක මහතා |
| 2. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ,<br>(අ) මීගමුව මහ නගර සභාව<br>(ආ) පෑලියගොඩ, ගම්පහ, මිනුවන්ගොඩ, කටුනායක, සීදූව සහ වත්තල–මාබෝලේ නගර සභා<br>(ඇ) කැළණිය, දළුගම, වේයන්ගොඩ, මීරිගම, කොච්චිකඩේ, කඳාන, වැලිසර, රාගම සහ හැඳල සුළු නගර සභා<br>(ඈ) බියගම, මහර, නාරන්වල, ගලහිටියාව, හෙනරත්ගොඩ බෙම්මුල්ල, එගොඩපොත සහ කටාන ගම් සභා<br>යන පළාත් පාලන බල මණ්ඩල යන්හි පරිපාලන සීමාවන් ඇතුලත වූ ප්‍රදේශය | එස්. දළුක්දෙනිය මහතා |
| 3. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ,<br>(අ) දෙහිවල–ගල්කිස්ස මහනගර සභාව<br>(ආ) කෝට්ටේ සහ මොරටුව නගර සභා<br>(ඇ) පිළියන්දල සුළු නගර සභාව<br>(ඈ) මාම්පේ–කැස්බෑව ගම් සභාව<br>යන පළාත් පාලන බල මණ්ඩල යන්හි පරිපාලන සීමාවන් ඇතුලත වූ ප්‍රදේශ | පී. එම්. චන්ද්‍රදස මහතා |
| 4. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ,<br>(අ) කොලොන්නාව හා අවිස්සාවේල්ල නගර සභාව<br>(ආ) මහරගම, හෝමාගම, කොටිකාවත්ත, මුල්ලේරියාව සහ බත්තරමුල්ල-තලංගම සුළු නගර සභා<br>(ඇ) කෝට්ටෙ–ගල්කිස්ස, කඩුවෙල, හංවැල්ලපේරුව සහ පාදුක්ක–වග ගම් සභා<br>යන පළාත් පාලන බල මණ්ඩල යන්හි පරිපාලන සීමාවන් ඇතුලත වූ ප්‍රදේශය | ඩී. එල්. උබයවර්ණ මහතා |

මෙහි පහත දැක්වෙන පරිපාලන දිස්ත්‍රික්කයන් තුල, ගෙවල් කුලී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශිත, සියලුම පළාත් පාලන බල මණ්ඩල සහ අනිකුත් සනීපාරක්ෂක, ගම් හා කඩ වීදි, ප්‍රදේශයන්ද කලින් කලට නිවාස හා ගොඩනැගිලි ඇමති විසින් එකී දිස්ත්‍රික්කයන් තුල ගෙවල් කුලී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයන් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ප්‍රදේශයන්ද,

| | | |
|---|---|---|
| 5. | කළුතර හා රත්නපුර ... | පී. ආර්. ජේ. සෙනෙවිරත්න මහතා |
| 6. | ගාල්ල, මාතර සහ හම්බන්තොට ... | ඩබ්. ජේ. වීරසේකර මහතා |
| 7. | යාපනය, වවුනියාව සහ මන්නාරම | කේ. තුලසිගාමණී මහතා |
| 8. | මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, අම්පාර සහ පොළොන්නරුව | ඩබ්. ඇන්. කේ. බී. වීරබාහු මහතා |
| 9. | කුරුණෑගල, පුත්තලම සහ හලාවත | ඇම්. සී. ඊ. ප්‍රනාන්දු මහතා |
| 10. | නුවරඑළිය, බදුල්ල සහ මොනරාගල | ආර්. වනසිංහ මහතා |
| 11. | මහනුවර, මාතලේ සහ කෑගල්ල ... | ජී. එම්. එච්. ගුණපාල බණ්ඩාර මහතා |

9-871—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව**

**මැතිවරණ කොට්ඨාශ අංක 32—අගලවත්ත**

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරලය දකුණ (වලල්ලාවිට) නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සංස්ථාපනය කරමින් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 1972 නොවැම්බර් මස 17 වෙනි දින අංක 34 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුනු නිවේදනයට අනුකූලව මහ ජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලබන්නේ 1946 (ලංකා පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 10(3) වැනි වගන්තිය යටතේ අංක 14,938/11 හා 1970.12.31 වැනි දින ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන දැන්වීමේ උපලේඛනයේ ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශයේ "ඒ" සිට "කේ", "ඕ", "කිව්" "ආර්" සහ "ඇක්ස්" සිට "ඕඕ" දක්වාවූ ඡන්ද කොට්ඨාශයන් සම්බන්ධයෙන් දක්වා ඇති විස්තරයන්හි සඳහන් "මහපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ" යන වචන වෙනුවට "පස්දුන් කෝරලය නැගෙණහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය" යන වචන ආදේශ කලයුතු බවත්, "ඇල්" සිට "ඇන්" හා "පී" සහ "ඇස්" සිට "ඩබ්ලිව්" දක්වා වූ ඡන්ද කොට්ඨාශයන් සම්බන්ධයෙන් දක්වා ඇති විස්තරයන්හි සඳහන් "මහපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ" යන වචන වෙනුවට හා "පීපී" සිට "ඩීඩීඩී" දක්වා වූ ඡන්ද කොට්ඨාශයන් සම්බන්ධයෙන් දක්වා ඇති විස්තරයන්හි සඳහන් "බටහිර පස්දුන් කෝරලය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ" යන වචන වෙනුවටද "පස්දුන් කෝරලය දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ" යන වචන ආදේශ කලයුතු බවත් ය.

කේ. එන්. ඩබ්ලිව්. අබේසේකර,
සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාශ අංක 32—අගලවත්ත.

1972 දෙසැම්බර් මස 5 වැනිදා,
කළුතර, මැතිවරණ කොට්ඨාශයේ දී ය.

9-812—73.09.28 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත**

11(2) දරණ වගන්තිය යටතේ කරන නිවේදනයයි

මෙහි පහත දක්වා ඇති හේතු වලින් කුමක් හෝ කරණකොට ගෙන නියමිත ප්‍රදේශයන්හි ඇති වී වගාවට සිදුවන අලාභ හානි 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත යටතේ සම්පාදනය වී ඇති පරිදි අනිවාර්ය ලෙස රක්ෂණ විය යුතු බැව් සියළු දෙනාගේම දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

හේතූන්—

1. ජලය අඩුවීම
2. නියඟය
3. ජලය වැඩිවීම
4. ගංවතුර ගැලීම
5. ගොයම් රෝග
6. කෘමි වසංගත
7. වල් ඌරන්
8. වල් අලින්
9. අනුමත ගොවිතැන් ක්‍රම

කේ. වීරවර්ධන,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 4, බුලර්ස් පටුමග,
කොළඹ 7,
1973 සැප්තැම්බර් මස 13 දින.

9-810/1—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

**1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත**

14 (3) වෙනි වගන්තිය යටතේ කරන නිවේදනයයි

ගොවිජන සේවා ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 14 වෙනි වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර නියමිත සෑම ප්‍රදේශයකම මහ කන්නයෙහි ගොවිතැන් කරන කාල සීමාවන් මෙහි දක්වන උපලේඛනයේ සඳහන් ලෙස විය යුතු බැව් මෙයින් නියම කරමි.

ඇන්. පුලේන්දිරන්,
ගොවිජන සේවා ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
4, බුලර්ස් පටුමග, කොළඹ 7,
1973 සැප්තැම්බර් මස 13 වැනි දින.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | මහ කන්නය: වැපිරීම ආරම්භ කළ යුතු දිනය | මහ කන්නය: ගොයම් කපා අවසාන කළ යුතු දිනය |
|---|---|---|---|
| 1. කොළඹ ... | (1) නැගෙනහිර හේවාගම් කෝරළය ... ... | ... ජූලි 1 | ... මාර්තු 30 |
| | (2) බටහිර හේවාගම් කෝරළය ... ... | ... අගෝස්තු 10 | ... මැයි 31 |
| | (3) බටහිර සියනෑ කෝරළේ මැද පත්තුව ... | ... ජූලි 1 | ... මාර්තු 10 |
| | (4) උතුරු අලුත්කුරු කෝරළය—ඒ ... ... | ... ජූලි 1 | ... මාර්තු 20 |
| | (5) දිවුලපිටිය ... ... ... | ... ජූලි 1 | ... මාර්තු 20 |
| | (6) උතුරු අලුත්කුරු කෝරළය—බී ... ... | ... ජූලි 1 | ... මාර්තු 20 |
| | (7) මුත්තැස් ප්‍රදේශ ... ... ... | ... — | ... — |
| 2. කළුතර ... | (1) බටහිර පස්දුන් කෝරළය ... ... | ... ජූලි 10 | ... මාර්තු 31 |
| | (2) කළුතර තොටමුණ උතුර ... ... | ... ජූලි 15 | ... මාර්තු 31 |
| | (3) කළුතර තොටමුණ දකුණ ... ... | ... ජූලි 15 | ... මාර්තු 31 |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | මහ කන්නය: වැපිරීම ආරම්භ කළ යුතු දිනය | මහ කන්නය: ගොයම් කපා අවසාන කළ යුතු දිනය |
|---|---|---|---|
| 3. මහනුවර | (1) උඩපළාත— | | |
| | ගොවි කාරක සභා අංක 80 | අගෝස්තු 1 | අප්‍රේල් 15 |
| | ගොවි කාරක සභා අංක 81 | අගෝස්තු 5 | ජනවාරි 1 |
| | ගොවි කාරක සභා අංක 83, 84, 85 සහ 86 | සැප්තැම්බර් 15 | අප්‍රේල් 15 |
| | ගොවි කාරක සභා අංක 82, 87, 88 සහ 89 | අගෝස්තු 1 | මාර්තු 31 |
| | ගොවි කාරක සභා අංක 90, 95, 96, 97 සහ 98 | සැප්තැම්බර් 15 | අප්‍රේල් 15 |
| | ගොවි කාරක සභා අංක 91, 92, 93 සහ 94 | ජූලි 15 | අප්‍රේල් 15 |
| | ගොවි කාරක සභා අංක 99, 100 සහ 101 | ජූලි 1 | මාර්තු 31 |
| | (2) මැද දුම්බර | ඔක්තෝබර් 5 | අප්‍රේල් 15 |
| 4. ගාල්ල | (1) ගහබඩ පත්තුව උතුර | ඔක්තෝබර් 1 | මාර්තු 31 |
| | (2) ගහබඩ පත්තුව දකුණ | ඔක්තෝබර් 1 | මාර්තු 31 |
| 5. මාතර | (1) වැලිගම් කෝරළය | ජූලි 1 | පෙබරවාරි 28 |
| | (2) ගහබඩ පත්තුව | ජූනි 1 | මාර්තු 15 |
| 6. හම්බන්තොට | (1) මාගම්පත්තුව | ඔක්තෝබර් 15 | අප්‍රේල් 15 |
| | (2) නැගෙනහිර ගිරුවා පත්තුව | ඔක්තෝබර් 15 | අප්‍රේල් 15 |
| | (3) දකුණු ගිරුවා පත්තුව | ජූලි 1 | අප්‍රේල් 15 |
| | (4) උතුරු ගිරුවා පත්තුව | ජූලි 1 | මාර්තු 31 |
| 7. යාපනය | (1) කරච්චි | සැප්තැම්බර් 25 | අප්‍රේල් 10 |
| 8. වවුනියා | (1) උතුරු වවුනියා | සැප්තැම්බර් 1 | අප්‍රේල් 30 |
| | (2) දකුණු වවුනියා (දෙමළ කොට්ඨාශය) | සැප්තැම්බර් 1 | අප්‍රේල් 15 |
| | (3) වෙන්ගල චෙඩ්ඩිකුලම් | සැප්තැම්බර් 1 | අප්‍රේල් 15 |
| 9. මඩකලපුව | (1) උතුරු මාන්මුනෙයි | ඔක්තෝබර් 1 | අප්‍රේල් 15 |
| | (2) බටහිර මාන්මුනෙයි—ගොවි කාරක සභා අංක 82 | ඔක්තෝබර් 1 | අප්‍රේල් 15 |
| | ගොවි කාරක සභා අංක 35, 37, 43 සහ 67 | ඔක්තෝබර් 1 | අප්‍රේල් 15 |
| | (3) දකුණු මාන්මුනෙයි සහ එරුවිල් පොරතිවු | ඔක්තෝබර් 1 | අප්‍රේල් 15 |
| | (4) කෝරළෙයි පත්තු | ඔක්තෝබර් 1 | මාර්තු 31 |
| 10. අම්පාර | (1) සමන්තුරෙයි පත්තු | ඔක්තෝබර් 15 | මැයි 15 |
| 11. ත්‍රිකුණාමලය | (1) කින්නියා | සැප්තැම්බර් 15 | මාර්තු 31 |
| | (2) තම්පලකාමම් | සැප්තැම්බර් 15 | මාර්තු 31 |
| | (3) කන්තලේ | සැප්තැම්බර් 15 | මාර්තු 31 |
| 12. කුරුණෑගල | (1) හිරියාල හත්පත්තුව | අගෝස්තු 15 | අප්‍රේල් 30 |
| | (2) පන්නල | ජූනි 15 | මාර්තු 31 |
| | (3) කුලියාපිටිය | ජූනි 15 | මාර්තු 31 |
| | (4) බිංගිරිය | ජූනි 15 | මාර්තු 31 |
| | (5) වාරියපොල | ජූලි 15 | අප්‍රේල් 15 |
| | (6) හෙට්ටිපොල | ජූලි 15 | අප්‍රේල් 15 |
| 13. අනුරාධපුරය | (1) මධ්‍යම නුවරගම් පළාත (කැකුලන්) | ඔක්තෝබර් 15 | අප්‍රේල් 30 |
| | (මඩට) | නොවැම්බර් 15 | අප්‍රේල් 30 |
| | (2) උතුරු නුවරගම් පළාත | ඔක්තෝබර් 15 | අප්‍රේල් 30 |
| | (3) උතුරු කලාගම් පළාත | ඔක්තෝබර් 15 | මැයි 15 |
| | (4) දකුණු කලාගම් පළාත | ඔක්තෝබර් 15 | මැයි 15 |
| | (5) බටහිර නුවරගම් පළාත | නොවැම්බර් 15 | අප්‍රේල් 30 |
| | (6) නැගෙනහිර නුවරගම් පළාත | නොවැම්බර් 15 | අප්‍රේල් 30 |
| | (7) දකුණු නුවරගම් පළාත | ඔක්තෝබර් 15 | ජූනි 15 |
| 14. බදුල්ල | (1) යටිකිඳ | ඔක්තෝබර් 1 | ජූලි 31 |
| | (2) පස්සර | දෙසැම්බර් 1 | සැප්තැම්බර් 30 |
| | (3) මැදකිඳ | ජනවාරි 10 | අගෝස්තු 31 |
| 15. රත්නපුරය | (1) නවදුන් කෝරළය— | | |
| | ගොවි කාරක සභා අංක 2, 4, 12, 24, 16 සහ 17 | අගෝස්තු 15 | පෙබරවාරි 28 |
| | ගොවි කාරක සභා අංක 5, 6, 13, 14, 15, 19, 21, 23, 25, 28, 29 සහ 31 | ඔක්තෝබර් 1 | අප්‍රේල් 30 |
| | (2) අටකලන් කෝරළය | සැප්තැම්බර් 1 | මැයි 15 |
| 16. කෑගල්ල | (1) දෙහිගම්පල් හා පහත බුලත්ගම් කෝරළය | අගෝස්තු 1 | අප්‍රේල් 30 |
| | (2) බෙලිගල් කෝරළය | අගෝස්තු 1 | අප්‍රේල් 15 |

9–810/2—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

### 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත

### 8(4) වගන්තිය යටතේ නිවේදනයයි

වර්ෂ 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 8(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර ගොවිජන සේවා ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් නාගමුත්තු පුලේන්දිරන් වන මම—

(අ) වගා රක්ෂණ පනත යටතේ සම්පාදිත ව්‍යවස්ථා අනුව අනිවාර්ය වශයෙන් රක්ෂණය වන වී ගොවිතැන් කෙරෙන මුළු කුඹුරු ප්‍රමාණයන් 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 8(4) වගන්තිය යටතේ 1972 ඔක්තෝබර් 13 වැනි දින අංක 29 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ පළමුවැනි උපලේඛනයේ සඳහන් වෙනස් කිරීම වලට යටත්ව, 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 8(4) වගන්තිය යටතේ 1971 ඔක්තෝබර් මස 8 වැනි දින අංක 14,979 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ පළමුවැනි උපලේඛනයේ සඳහන් ලෙස බැව්, හා

(ආ) ඉහත සඳහන් (අ) ඡේදය යටතේ නියම කර ඇති සේ කුඹුරු ප්‍රමාණයන්වල වී අස්වැන්නට මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ හිමිකම් ඇති පුද්ගලයන් සහ එම අස්වැන්නෙන් ඔවුන්ට හිමි විය යුතු කොටස් ප්‍රමාණයන් 2 වෙනි උපලේඛනයේ සඳහන් ලෙස විය යුතු බවද මෙයින් නියම කරමි.

ඇන්. පුලේන්දිරන්,
ගොවිජන සේවා ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
4, බුලර්ස් පටුමග, කොළඹ 7,
1973 සැප්තැම්බර් 13 වෙනි දින.

2 වැනි උපලේඛනය

රක්ෂණය වූ අයගේ විස්තර

(කුඹුරු පනතේ විග්‍රහ කර ඇති අන්දමට)

| | වගාවෙන් ලැබෙන කොටස |
|---|---|
| (i) ඉඩම් හිමි ගොවියා ... ... | 100% |
| (ii) ගොවි කුලීකරුවන් යොදන ගොවිතැන් නො කරන ඉඩම් හිමියා ... ... | 100% |
| (iii) ගොවි කුලීකරුවන් යොදන බදුකරු ... | 100% |
| (iv) අඳ ගොවියා අඩුම වශයෙන්... ... | 75% |
| (v) අඳ ගොවීන් ලවා කුඹුරු වැඩකරවන ඉඩම් හිමියා වැඩිම වශයෙන් ... ... | 25% |
| (vi) අඳ ගොවීන් ලවා කුඹුරු වැඩකරවන බදුකරු වැඩිම වශයෙන් ... ... | 25% |

9–810/3—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

## 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත

### 13(3) (අ) දරණ වගන්තිය යටතේ කරන නිවේදනයයි

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 13(3) (අ) දරණ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිජන සේවා කොමසාරිස් වන කරුණාදස වීරවර්ධන වන මම, රක්ෂිතවූ බිම් ප්‍රමාණයන්හි ඉතාම අඩු වශයෙන් පිළිපැදිය යුතු ගොවිතැන් ක්‍රම හා සම්මත කරන ලද විශේෂ ගොවිතැන් ක්‍රම මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි අන්දමට විය යුතු බව මෙයින් නියම කරමි.

කේ. වීරවර්ධන,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 4, බුලර්ස් පටුමග,
කොළඹ 7,
1973 සැප්තැම්බර් 13 දින.

උපලේඛනය

අඩුම වශයෙන් අනුගමනය කළයුතු ගොවිතැන් ක්‍රම—

1. නියරවල් සහ වේලි අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.
2. බිම් කෙටීම හෝ/සහ හෑම හෝ/සහ මඩ කිරීම හෝ/සහ මට්ටම් කිරීම.
3. වී වැපිරීම.
4. වගාව ගැන සැලකිලිමත්වීම හා එය ආරක්ෂා කිරීම.
5. වගාවට සිදුවන හානිය වැළැක්වීමට හෝ අඩු කිරීමට පිළියම් යෙදීම.
6. අස්වැන්න කපා ගැනීම.

විශේෂ ගොවිතැන් ක්‍රම—

1. පෙලට වී ඉසීම හෝ පැල සිටවීම හෝ පෙලට පැල සිටවීම
2. අනුමත කරන ලද පොර වර්ග යෙදීම.
3. වල් නෙලීම සහ/හෝ වල් පැලෑටි නාශක බෙහෙත් විදීම හෝ පැල හෑම.

9–810/4—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය: සී/අයි. 219.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4(2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කැරණය පිළිබඳව ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1 සහ සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ්, ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා බිල්ඩින් තැ. පෙ. 1363, බේලි වීදිය, කොළඹ 1, අතර කාර්මික ආරවුලක් පවතී.

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නාවූ කාර්මික අධිකරණයක් වෙත යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹදීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

ලංකා වෙළඳ සේවක සංගමය,
22 1/1, ඉහළ චැතැම් වීදිය,
කොළඹ 1.,

සහ

සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ්,
ස්ටේට් බෑනක් ඔෆ් ඉන්ඩියා බිල්ඩින්,
තැ. පෙ. 1363, බේලි වීදිය, කොළඹ 1.,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ් විසින් නාත්තන්ඩියේ හා රත්මලානේ කර්මාන්ත ශාලාවල සේවයේ යොදවා සිටින තම සාමාජිකයන්ට 1972 පෙබරවාරි 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන ලෙස 1971 අංක 3 දරන සාමූහික ගිවිසුමේ 17 (1) වන වගන්තියේ සලසා ඇති පරිදි පදනම් කරගෙන පුනරාවර්තනය නොවන්නාවූ ජීවනාධාර පාරිතෝෂික දීමනා ගෙවනු ලෙස කරන ලංකා වෙළඳ සේවක සංගමයේ ඉල්ලීම යුක්ති සහගතද යන්නත්, ඔවුන්ට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 14 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

9–873—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : සී/අයි. 219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 136 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් රාජ්‍ය සංස්ථා හා වෙළඳ සේවා සංගමය, 53, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10 සහ සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ්, ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්ඩියා බිල්ඩිං, තැ. පෙ. 1363, බේලි වීදිය, කොළඹ අතර කාර්මික ආරවුලක් පවතී.

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නාවූ කර්මික අධිකරණයක් වෙත යොමු කරමි

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක්සත් රාජ්‍ය සංස්ථා හා වෙළඳ සේවා සංගමය,
53, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10

සහ

සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ්,
ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්ඩියා බිල්ඩිං,
තැ. පෙ. 1363, බේලි වීදිය,
කොළඹ 1

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්න කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ සිලෝන් ග්ලාස් කොම්පැණි ලිමිටඩ් විසින් නාත්තන්ඩියේ කර්මාන්ත ශාලාවේ සේවයේ යොදවා සිටින තම සාමාජිකයන්ට 1972 පෙබරවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1971 අංක 3 දරණ සාමූහික ගිවිසුමේ 17 (1) වන වගන්තියෙන් සලසා ඇති පරිදි පදනම් කරගෙන පුනරාවර්තන නොවන්නාවූ ජීවනාධාර පාරිතෝෂික දීමනා ගෙවන ලෙස එක්සත් රාජ්‍ය සංස්ථා හා වෙළඳ සේවා සංගමයේ ඉල්ලීම යුක්ති සහගතද යන්නත්, ඔවුන්ට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 සැප්තැම්බර් මස 14 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

9-874—73.09.28 දින අංක 79 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සී/අයි. 795.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 සහ මොරිස් රෝච් ලිමිටඩ්, තැ. පෙ. 61, කොළඹ අතර කාර්මික ආරාවුලක් පවතී.

